# වාර්ෂික වාර්තාව
# 2014- 2015

ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

# පටුන


දැක්ම, මෙහෙවර සහ සංස්ථාපිත අරමුණු ---------- 04

අරමුණු, කාර්යයන් හා සේවාවන් සහ වසරේ ප්‍රගතිය ---------- 05

සංස්ථාපිත තොරතුරු ---------- 06

සභාපතිතුමාගේ පණිවිඩය ---------- 07

ජ්‍යේෂ්ඨ කළමණාකාරිත්වය සහ අංශ ප්‍රධානීන් ---------- 08

භාණ්ඩ නාමාවලිය ---------- 9-11

ව්‍යාපාර සමාලෝචනය ---------- 12

දීප ව්‍යාප්ත ශාඛා ජාලය ---------- 13

රැකියා උත්පාදන ---------- 14

e- සේවා සැපයුම් පද්ධතිය ---------- 15

සංස්ථාපිත පිලිගත් සම්මතයන් ---------- 16

මූල්‍ය කාර්යසාධනය ---------- 17

ප්‍රස්ථාරික නිරූපනය ----------18-20

වෙළඳ අංශ ප්‍රගතිය ---------- 21

විගණකවරුන්ගේ වාර්තාව ---------- 22

මුළු ආදායම් ප්‍රකාශය ---------- 23

මූල්‍ය තත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය) ---------- 24

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය ---------- 25

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ---------- 26

මූල්‍ය වාර්තා සඳහා සටහන් ---------- 27-46

# දැක්ම, මෙහෙවර හා සංස්ථාපිත අරමුණු

## දැක්ම

දේශීය ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම.

## මෙහෙවර ප්‍රකාශය

වෙළඳ පොළේ පාරිභෝගිකයින්ගේ අවශ්‍යතාවයන් සපයා දීමට අමතරව, රජයේ ආයතනවල මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි කර ගැනීමට හේතු වන පරිදි ආයතනවල සියළුම භාණ්ඩ සහ සේවා සැපයීම සහ එස්.ටී.සී. ආයතනයට සම්බන්ධ සියළුම පාර්ශවයන්ගේ අභිවෘධිය මුල් කරගෙන සහ ශ්‍රී ලංකාව ආසියාවේ වාණිජ කේන්ද්‍රය වීමට උපකාරී විය.

## සංස්ථාපිත අරමුණු

“සාධාරණ ඉපැයීම්, පුද්ගල හා වෘත්තීය සංවර්ධනය සඳහා දායකත්වයක් ලබා දීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය නියම කරගත් පරිදි විශේෂිත වෙළඳනාමයක් යටතේ නිෂ්පාදන නායකත්වයක් පිහිටුවා ගැනීම.”

# අරමුණු

- විවිධත්වයෙන් යුතු භාණ්ඩ විකුණුම්කරණය හා එමගින් වෙළඳපොල තුල ස්ථාවර වීම.
- ජාත්‍යන්තර වෙළඳපොලෙහි ඇති කීර්තිමත් සහ විශ්වාසදායි වෙළඳ නාමයන් අප රට තුල නියෝජනය කිරීම.
- ආයතනයේ අදායම හා ලාභය වර්ධනය කර සහ එමගින් ආයතනයේ නාමය ප්‍රචලිත කරලීම.
- රාජ්‍ය අංශයේ අවශ්‍යතා කාර්යක්ෂම අයුරින් ඉටුකිරීම මගින් සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම.
- පාරිභෝගික අවශ්‍යතා ඉටු කරලීම සඳහා ආයතනයේ ප්‍රධාන නිශ්පාදන ආයෝජන ක්ෂේත්‍ර මගින් කටයුතු දියත් කිරීම.
- රජය, පාරිභෝගිකයන් හා සේවක මණ්ඩලය පිළිබඳව නිරන්තර අවධානය යොමුකරමින් ඵලදායිතාවය වර්ධනය කිරීමට කටයුතු කිරීම.

# කාර්යයන් හා සේවාවන්

- පාරිභෝගික ප්‍රවේශය පහසු කරලීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.
- දැනට පිහිටුවා ඇති ප්‍රදර්ශනාගාර වලට අමතරව නවතම මෙගා ප්‍රදර්ශනාගාර පිහිටුවීම.
- ගණුදෙණුකරුවන්ගේ අවශ්‍යතාවය මත භාණ්ඩ නාමාවලිය වැඩි කිරීම.
- වෙබ් අඩවි ආශ්‍රිත ව්‍යාපාර කළමණාකරණය සහ සම්පත් සැලසුම් පද්ධතීන් ක්‍රියාත්මක කිරීම මගින් දත්ත කළමණාකරණය, ප්‍රසම්පාදන අනුමැතිය සහ මානව සම්පත් කළමණාකරණය සිදු කිරීම.
- ප්‍රධාන ආයෝජන නිශ්පාදන ක්ෂේත්‍රයන්හි කාර්යක්‍ෂම ලෙස නියැලීම.

# 2014 - 2015 වසරේ ප්‍රගතිය

මෙම ආයතනයේ ව්‍යාපාරික පිරිවැටුම රු.මි 3,862 ක් ලෙස වාර්තාගත වූ අතර පසුගිය වසර හා සැසඳීමේදී එය 21% ක වැඩිවීමේ ප්‍රතිශතයකි. තවද වෙනත් ආදායම් ලෙස රු.මි. 4.8 උපයා ඇත. තවද ආදායම් බදු වලට පෙර ලාභය රු.මි. 10.6 ක් විය. පසුගිය වසර හා සැසදීමේදී විකිණුම් 21% කින් වැඩි වූවද ආදායම් බදු වලට පෙර ශුද්ධ ලාභය රු.මි. 74 සිට රු.මි. 10.6 දක්වා පහත බැසීමට බොහෝ හේතු සාධක බලපාන ලදී .

2015 ජනවාරි මාසයේදී පැවැත්වූ ජනාධිපති මැතිවරණයෙන් පසු ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ ( විවිධ ) නීතිගත සංස්ථාවේ කළමණාකරන ක්‍රියාවලියේ බොහෝ වෙනස්කම් සිදු විය . සභාපතිත්වය සහ අධ්‍යක්‍ෂක මණ්ඩල සංයුතියේ ඇති වූ වෙනස්කම් සමඟම අනපේක්‍ෂිත ව්‍යාපාර අභියෝගයන්ට මුහුණ දීමට සිදු විය. එස්.ටී.සී ආයතනයේ පාරිභෝගික සංයුතිය රාජ්‍ය අංශය නියෝජනය කරන ආයතන බැවින් 2015 ජනවාරි මස පැවැත්වූ මහ මැතිවරණයට පෙර විශාල වශයෙන් ලබාගත් අලෙවි ඇණවුම් සහ ගණුදෙනු කරුවන් සඳහා ගෙවිය යුතු ණය සහ ණයගැතියන්ගෙන් ලබා ගැනීමට තිබූ මුදල් සම්බන්ධව ආයතනයට අර්බුදයන් රැසකට මුහුණ පෑමට සිදුවිය. විශාල වශයෙන් පැවති වෙළඳ බඩුතොගය විකුණුම් බවට පරිවර්තනය කර ගැනීමට නොහැකි වීම සහ ණයගැතියන්ගෙන් මුදල් ලබා ගැනීමට නොහැකි වීම නිසා අසාමාන්‍ය ලෙස ණය ගැතියන්ගේ වැඩි වීමක් සිදුවිය. මේ ආකාරයේ බහුවිධ බලපෑම් හේතු කොටගෙන ආයතනයේ සමස්ථ පොදු කාර්ය්‍ය වියදම් ඉතා සීඝ්‍ර ලෙස ඉහල යාමකට ලක්විය. පරිපාලනමය වියදම් 36% කින්ද, විකුණුම් සහ බෙදා හැරීමේ වියදම් 27% කින් සහ මූල්‍යමය පිරිවැය 39% කින්ද ඉහල යාමකට ලක්විය. එසේ වුවද එස්.ටී.සී ආයතනයේ කළමණාකාරිත්වය විසින් 2014/ 2015 වර්ෂයේ බදුපෙර ශුද්ධ ලාභය රු.මි 10.6 ක් ලෙස සනිටුහන් කිරීමට සමත් විය.

2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුල එස්.ටී.සී ආයතනයේ සේවක සංඛ්‍යාව 395 කි. එමෙන්ම අප නිශ්පාදන සමාගම් සමඟ සහයෝගීත්වයෙන් එස්.ටී.සී වෙළඳ නාමය යටතේ නව භාණ්ඩ රැසක් වෙළඳ

# සංස්ථාපිත තොරතුරු

| | |
|---|---|
| **සමාගමේ නම** | සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව |
| **නෛතික ස්වභාවය** | එස්.ටී.සී. ජෙනරල් ට්‍රේඩිං සමාගම වශයෙන් පැවති සමාගමේ නම 2010.10.01 දින සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව ලෙස 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලදි. මීට පෙර 1982 අංක 17 දරණ සමාගම් පනතට අනුව ලංකා ජෙනරල් ට්‍රේඩිං කම්පැණි ලිමිටඩ් වශයෙන් පැවති මෙම සමාගම එයටත් පෙර 1970 අංක 33 දරණ සමාගම් පනත යටතේ පිහිටුවන ලද රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වේ. එසේම මෙම සමාගම කර්මාන්ත හා වාණිජ අමාත්‍යංශයේ අනුබද්ධිත සමාගමකි. |
| **සභාපති / කළමණාකාරී අධ්‍යක්ෂක** | ප්‍රදීප් ගුණවර්ධන මහතා - ඉවත්වීම: 09.01.2015<br>හුසේන් බයිලා මහතා - ඉවත්වීම: 15.10.2015<br>ආචාර්ය ඒ. එම්. ජමීල් මහතා - පත්වීම: 08.11.2015 |
| **අධ්‍යක්‍ෂකවරු** | බී.එම්.සී.කේ.බස්නායක මහතා - ඉවත්වීම: 09.01.2015<br>රංජිත් කල්දේරා මහතා - ඉවත්වීම: 09.01.2015<br>එස්.ඒ.සී කුලතිලක මහත්මිය - ඉවත්වීම: 09.01.2015<br>පී.එම් පෙරේරා මහත්මිය - ඉවත්වීම: 09.01.2015<br>ඊ.එල් රාජපක්ෂ මහතා - ඉවත්වීම: 09.01.2015<br>එස්.එල් ඩීන් මහතා - පත්වීම: 12.02.2015<br>ඩී ජීවනන්දන් මහතා - පත්වීම: 27.02.2015<br>වී නිතාර්සන් මහතා - පත්වීම: 27.02.2015<br>අයන්ති ද සිල්වා මහත්මිය - ඉවත්වීම: 03.11.2015<br>ටී. වී වීරසේන මහතා - පත්වීම: 12.01.2015 |
| **සමාගමේ ලේකම්** | කේ.එල්. මැනේජ්මන්ට් කන්සල්ටන් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| **අධ්‍යක්‍ෂක මණ්ඩල ලේකම්** | කේ.ජී.එස්.පී. විජයරත්න මහතා |
| **විගණකවරු** | දයානන්ද සමරවික්‍රම සහ සමාගම<br>වරලත් ගණකාධිකාරීවරු<br>නො.20/26, දුම්රියපොළ පොළ පාර<br>නුගේගොඩ<br>(විගණකාධිපති විසින් පත් කරන ලදී) |
| **බැංකුකරුවන්** | මහජන බැංකුව<br>ලංකා බැංකුව<br>ජාතික සංවර්ධන බැංකුව<br>සම්පත් බැංකුව |
| **ලියාපදිංචි කාර්යාලය** | තැ.පෙ. 1686<br>100, නවම් මාවත,<br>කොළඹ 2.<br>ශ්‍රීලංකා<br>දුරකථන: 242 2341-3<br>ෆැක්ස්: 244 7970<br>විද්‍යුත් තැපෑල : lankagen@sltnet.lk<br>වෙබ් අඩවිය : www.stcgeneral.com |
| **සමාගම් ලියාපදිංචි අංකය** | PB 863 |
| **සේවකයන් සංඛ්‍යාව** | 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සමාගම විසින් සේවකයන් 395 දෙනෙකු සේවයේ නියුක්ත කොට ඇත |

# සභාපති තුමාගේ පණිවිඩය

2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුල මම ආයතනයේ සභාපති දූරයේ රාජකාරීන්හි නිරත නොවූවත් ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය විසින් සපයා ඇති තොරතුරු අනුව 2014 අප්‍රේල් මස සිට 2015 මාර්තු මාසය දක්වා ඇති කාලයට ඇතුලත් විගණනය කරන ලද වාර්ෂික ගිණුම් සහ වසර තුල සිදුවු කාර්යය සාධනය පිළිබද කෙටි විග්‍රහයක් ඉදිරිපත් කරමි.

## 2014-2015 කාලය තුල සිදුවූ ප්‍රගතිය

ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ ( විවිධ ) නීතිගත සංස්ථාවේ ව්‍යාපාර ආදායම පසුගිය වසරට සාපේක්ෂව 21% ක වර්ධනයක් සනිටුහන් වී ඇති අතර විකුණුම් ආදායම රු.මි 3,862 ක් ලෙස වාර්ථාගත කරඇත. එමෙන්ම වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස රු.මි 4.8 උපයා ගැනීමට හැකි වී ඇත . බදු පෙර ශුද්ධ ලාභය රු .මි 10.6 කි. පසුගිය වසර හා සසදන විට 21% කින් විකුණුම් ආදායම ඉහල ගියද බදු පෙර ශුද්ධ ලාභය රු.මිලියන 74 සිට 10.6 දක්වා පහත වැටීමට බොහෝ හේතු සාධක බලපා ඇත.

2015 ජනවාරි මාසයේදී පැවැත්වූ ජනාධිපති මැතිවරණයෙන් පසු ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ ( විවිධ ) නීතිගත සංස්ථාවේ කළමණාකරන ක්‍රියාවලියේ බොහෝ වෙනස්කම් සිදු විය . සභාපතිත්වය සහ අධ්‍යක්ෂක මණ්ඩල සංයුතියේ ඇති වූ වෙනස්කම් සමඟම අනපේක්ෂිත ව්‍යාපාර අභියෝගයන්ට මුහුණ දීමට සිදු විය. එස්.ටී.සී ආයතනයේ පාරිභෝගික සංයුතිය රාජ්‍ය අංශය නියෝජනය කරන ආයතන බැවින් 2015 ජනවාරි මස පැවැත්වූ මහ මැතිවරණයට පෙර විශාල වශයෙන් ලබාගත් අලෙවි ඇණවුම් සහ ගණුදෙනු කරුවන් සඳහා ගෙවිය යුතු ණය සහ ණයගැතියන්ගෙන් ලබා ගැනීමට තිබූ මුදල් සම්බන්ධව ආයතනයට අර්බුදයන් රැසකට මුහුණ පෑමට සිදුවිය. විශාල වශයෙන් පැවති වෙළඳ බඩුතොගය විකුණුම් බවට පරිවර්ථනය කර ගැනීමට නොහැකි වීම සහ ණයගැතියන්ගෙන් මුදල් ලබා ගැනීමට නොහැකි වීම නිසා අසාමාන්‍ය ලෙස ණය ගැතියන්ගේ වැඩි වීමක් සිදුවිය. මේ ආකාරයේ බහුවිධ බලපෑම් හේතු කොටගෙන ආයතනයේ සමස්ථ පොදු කාර්යය වියදම් ඉතා සීග්‍ර ලෙස ඉහල යාමකට ලක්විය. පරිපාලනමය වියදම් 36% කින්ද, විකුණුම් සහ බෙදා හැරීමේ වියදම් 27% කින් සහ මූල්‍යමය පිරිවැය 39% කින්ද ඉහල යාමකට ලක්විය. එසේ වූවද එස්.ටී.සී ආයතනයේ කළමණාකාරීත්වය විසින් 2014/ 2015 වර්ෂයේ බදුපෙර ශුද්ධ ලාභය රු.මි 10.6 ක් ලෙස සනිටුහන් කිරීමට සමත් විය.

## අනාගත සැලැස්ම

මා විසින් අධ්‍යක්ෂක මණ්ඩලයේද සහයෝගය ඇතිව සෙමින් අලෙවි වන වෙළඳ බඩුතොගය ඉක්මනින් මුදල් කර ගැනීමටත් ,පොදු කාර්යය සහ මූල්‍ය පිරිවැයට බරක් වී ඇති දිගුකාලීන ණයගැතියන් සඳහා නීතිමය පියවර ගෙන, මුදල් අයකර ගැනීම සඳහාද මූලික පියවරයන් ගෙන තිබේ. තොග සහ සිල්ලර ව්‍යාපාර සඳහා බලපාන එකතු කල අගය මත අයකරනු ලබන බදු නිර්දේශයන්ද (Deemed Vat) එස්.ටී.සී ආයතනයට වෙළඳ පොල තුල තරඟ කිරීම සඳහා ප්‍රධාන වශයෙන් බලපාන තවත් අභියෝගයක් වී ඇත . එකතු කල අගය මත ගෙවනු ලබන බදු නිර්දේශයන් ( Deemed Vat) සඳහා එස්.ටී.සී ආයතනය යටත් වනවාද යන්න පිළිබඳවද එසේ නොවේ නම් එයින් මිදීම සඳහා අවශ්‍ය මූලික පියවරයන්ද මේ වන විට ආයතනය විසින් සිදුකර ගෙන යනු ලැබේ.

දැනටමත් අප විසින් වෙළඳ පොළ තුල ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ ( විවිධ ) නීතිගත සංස්ථාවේ වෙළඳ නාමය ස්ථාපිත කිරීම සඳහා නිශ්පාදිත ආයතන සමඟ අත්වැල් බැදගෙන එස්.ටී.සී නාමය යටතේ භාණ්ඩ වෙළඳ පොළට ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත . ඒ අතුරින් එස්.ටී.සී ඡායා පිටපත්, ලිපි ද්‍රව්‍ය සහ එස්.ටී.සී ජෙනරල් වායු සමීකරණ යන්ත්‍ර පෙන්වා දිය හැකි අතර තවත් බොහෝ නිශ්පාදන එස්.ටී.සී වෙළඳ නාමය යටතේ වෙළඳ පොළට ඉදිරිපත් කිරීම සඳහා සැලසුම් සකස් කර ඇත .

එස්.ටී.සී ආයතනය විසින් මෙතෙක් වෙළඳ පොළ තුල සහයෝගය ලබාගෙන නොමැති රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන ප්‍රධානීන් සමඟ සාකච්ජා පවත්වා ආයතනයට වෙළඳ පොළ තුල ප්‍රතිලාභ වැඩිකර ගැනීම සඳහා මූලික පියවරයන් තබා ඇත. මූල්‍ය ආයතන සමඟ නැවත සාකජ්චා පවත්වා , ණය පහසුකම් සඳහා පවතින පොලී අනුපාත අඩුකර ගැනීමට සහ 2016 වර්ෂයේ අපේක්ෂිත ප්‍රතිලාභයන්ට ලගාවීම සඳහා බැංකු පොලී අනුපාත අඩුකර ගැනීම සඳහාද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත .

ඉහත අප විසින් අනුගමනය කර ඇති යම් යම් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ ( විවිධ ) නීතිගත සංස්ථාවේ ශුද්ධ ලාභ ප්‍රස්ථාරය නව මඟකට හැරී යාමේ ප්‍රවනතාවයක් 2016 වසරේදී සිදුවනු ඇති බවට අපට විශ්වාසයක් පවති .

අවසාන වශයෙන් මෙම කාර්යයන් සාර්ථකව ඉටුකර ගැනීම සඳහා මිලකල නොහැකි සහයෝගයක් ලබා දුන් අධ්‍යක්ෂක මණ්ඩලය ඇතුළු සමාගමේ ලේකම් තුමාට සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහයෝගය සහ මගපෙන්වීම යටතේ අපගේ විගණකවරුන් වන දයානන්ද සමරවික්‍රම විගණක ආයතනයටද එස්.ටී.සී ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වයටද මාගේ හදපිරි කෘතඥතාවය පිරිනමන්නෙමු .

ආචාර්ය ඒ එම් ජමීල්
සභාපති /කළමණාකරණ අධ්‍යක්ෂක
ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ ( විවිධ ) නීතිගත සංස්ථාව

# ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය සහ අංශ ප්‍රධානීන්

## ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය

| | |
|---|---|
| සභාපති/කළමණාකාර අධ්‍යක්ෂක | ආචාර්ය ඒ. එම්. ජමීල් |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂක | එස්. එල්. ඩීන් මහතා |
| සාමාන්‍යාධිකාරී | පැරකුම් විජයරත්න මහතා |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වෙළඳ ක්‍රියාකාරීත්වය සහ පාලන | උපාලි අබේසේකර මහතා |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් සහ ප්‍රවාහන | උපාලි කෝරලේගෙදර මහතා |
| මුදල් කළමණාකාර | මෙරිල් නෝනිස් මහතා |
| සහකාර සාමාන්‍යාධිකාරී (අලවිකරණ) | චමිලා ඉද්දමල්ගොඩ මහත්මිය |

## අංශ ප්‍රධානීන්

| | | |
|---|---|---|
| රසායන ද්‍රව්‍ය අංශය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | උපාලි අබේසේකර මහතා |
| කාර්යාලීය උපකරණ අංශය | වැ.බ.සහකාර කළමණාකාර | සීතා ජයන්ති මහත්මිය |
| ගෘහ උපකරණ අංශය | වැ.බ. කළමණාකාර | කුසල් පතිරණ මහතා |
| තොරතුරු තාක්ෂණ අංශය | කළමණාකාර-ICT සේවා | ප්‍රියන්කර අපෝන්සු මහතා |
| | සහකාර කළමණාකාර- අලෙවිකරණ | ධර්මරත්න ධනන්ජය මහතා |
| | සහකාර කළමණාකාර-වෙළඳ | අනුපමා පීරිස් මහත්මිය |
| විදයුත් හා විදුලි උපකරණ අංශය | වැ.බ. ජ්‍යෙෂ්ඨ කළමණාකාර | විපුල ද සිල්වා මහතා |
| ස්වශක්ති කෘෂි උපකරණ සහ යාන්ත්‍රික උපකරණ අංශය | සහකාර කළමණාකාර | මදුශානි අරුග්ගොඩ මහත්මිය |
| ඉදිකිරීම්,ලෝහ භාණ්ඩ සහ කාර්යාලීය ගෘහභාණ්ඩ අංශය | අලවි විධායක | අනුරුද්ධ මහේෂ් මහතා |
| ටයර් සහ බැටරි අංශය | කළමණාකාර | කේ. ඒ. සෝමරත්න මහතා |
| පාරිභෝගික භාණ්ඩ අංශය | කළමණාකාර | ඒ. එස්. චන්ද්‍රසිරි මහතා |
| ප්‍රදර්ශනාගාර අධීක්ෂණය | කළමණාකාර | ගයාන් රණතුංග මහතා |
| තීරුබදු සහිත වෙළඳ අංශය | සහකාර කළමණාකාර | කෙනෙත් ජයසුන්දර මහතා |
| ප්‍රසම්පාදන අංශය | ජ්‍යෙෂධ කළමණාකාර | මහේෂ් මෙන්ඩිස් මහතා |
| මුදල් අංශය | මුදල් කළමණාකාර | මෙරිල් නෝනිස් මහතා |
| තොරතුරු තාක්ෂණ අංශය | වැ.බ. ජ්‍යෙෂධ කළමණාකාර | නිරෝෂ් බණ්ඩාර මහතා |
| අභ්‍යන්තර විගණන අංශය | ගණකාධිකාරිනි- අභ්‍යන්තර විගණක | නිශාන්ති මෙන්ඩිස් මහත්මිය |
| මානව සම්පත් අංශය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | උපාලි කෝරලේගෙදර මහතා |

## එස්.ටී.සී. ප්‍රදර්ශනාගාර

1) නවම් මාවත ප්‍රදර්ශනාගාරය, කොළඹ 02

2) කුරුණෑගල ප්‍රදර්ශනාගාරය නො.249/3/1, පුත්තලම් පාර,කුරුණෑගල

3) නුවර ප්‍රදර්ශනාගාරය නො.449,විලියම් ගොපල්ලව මාවත, නුවර

4) මාතර ප්‍රදර්ශනාගාරය නො.11, YMCA ගොඩනැගිල්ල, දුම්රියපල පාර,මාතර

5) අනුරාධපුර ප්‍රදර්ශනාගාරය 561-B ,38 4th මාවත, අනුරාධපුර

6) යාපනය ප්‍රදර්ශනාගාරය නො. 127,MPCS ගොඩනැගිල්ල, KKS පාර,යාපනය

7) ගල්කිස්ස ප්‍රදර්ශනාගාරය නො. 103,වෙළඳ සංකීර්ණය, ගල්කිස්ස

# භාණ්ඩ නාමාවලිය



## කාර්යාලීය ලිපිද්‍රව්‍ය

ඩබල් ඒ සහ අනෙකුත් ෆොටෝ කොපි පේපර්, බෝඩ්, පොත්, ෆයිල් කවර සහ රැදවුම්, ලියුම් කවර, කාර්යාලීය බෑග්, පෑන් සහ පැන්සල්, වයිට් බෝඩ් සහ පෑන්, කතුරු, ඝණක යන්ත්‍ර, ස්ටේප්ලර් සහ පන්චර්, සීඩී සහ ඩීවීඩී ඇතුළු අනෙකුත් සියළුම කාර්යාලීය උපකරණ



## ගෘහ උපකරණ

ඇළුමිනියම් භාණ්ඩ, පෝසිලේන් නිෂ්පාදන, මුළුතැන්ගෙයි උපකරණ, සියළුම වර්ගයේ පිරිසිදුකාරක, ක්‍රීඩා උපකරණ, ප්ලාස්ටික් උපකරණ, පීරිසි කෝප්ප,හැදි ගෑරුප්පු, කේතල් සහ ජෝග්ගු , වතුර ෆිල්ටර්, කොට්ට, මෙට්ට සහ ඇඳ ඇතිරිලි, රබර් කාපට්, බරකිරණ උපකරණ, කුඩ සහ වැහි කබා, බිත්ති ඔරලෝසු, අත් පිස්නා සහ සියළුම කඩදාසි නිෂ්පාදන



## තොරතුරු තාක්ෂණ ආශ්‍රිත උපකරණ

ලැප් ටොප්, පරිඝණක සහ මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් සහ ස්කෑන් යන්ත්‍ර , ෆොටෝ කොපි යන්ත්‍ර සහ සියළුම පරිඝණක උපාංග



## විදුලි හා විද්‍යුත් උපාංග

වායු සමීකරණ යන්ත්‍ර,KDKෆෑන්, ඩිජිටල් කැමරා, බහු මාධ්‍ය ප්‍රොජෙක්ටර් සහ ස්කෑන් යන්ත්‍ර ,ගෘහස්ථ සහ එළිමහන් ස්පීකර්, ජෙනරේටර්, සී.සී.ටී.වී පද්ධති, වේලා සටහන් යන්ත්‍ර, CFL බල්බ්, ආපදා පහන් දුරකථන, වයරින් උපකරණ ඇතුළු අනෙකුත් විදුලි උපාංග

# භාණ්ඩ නාමාවලිය



## වේගයෙන් අලෙවිවන පාරිභෝගික භාණ්ඩ

Homecare Products
Personel Care Products
Food Brands

---




## ටයර් සහ "EXIDE" බැටරි

APOLLO
DUNLOP
PIRELLI
YOKOHAMA
NANKANG
EXIDE

---



## කෘෂිකාර්මික උපකරණ ඇතුළු යන්ත්‍රෝපකරණ

කටු කම්බි, තණකොළ කපන මැෂිම, වෙල්ඩින් ට්‍රාන්ස්ෆෝමර්, පිහි, කැති, සියළුම වර්ගයේ විදුලි මෙවලම්, අත් මෙවලම්, වතුර පොම්ප, ආරක්‍ෂිත උපකරණ ( හිස්වැසුම් අත්මේස් සපත්තු ) පොලිතින් සීලර්

---



## යතුරුපැදි

මෝටර් බයිසිකල් (100cc,110cc,125cc,150cc ,180 cc ) , ස්කූටර්

---



## අභ්‍යන්තර සැලසුම් නිර්මාණකරනය සහ කාර්යාලීය ගෘහභාණ්ඩ

වානේ ගෘහ භාණ්ඩ (පුටු, මේස, කබඩ්, කැබිනට්, පොත් රාක්ක)
දැව භාණ්ඩ (පුටු, මේස, කබඩ්, කැබිනට්, පොත් රාක්ක)
මෙලමයින් ගෘහ භණේඩ (පුටු, මේස, කබඩ්, කැබිනට්, පොත් රාක්ක)



## රසායනික ද්‍රව්‍ය

කර්මාන්ත ආශ්‍රිත රසායනික ද්‍රව්‍ය, පරීක්ෂණාගාර රසායනික ද්‍රව්‍ය, විශේෂිත රසායනික ද්‍රව්‍ය, තෝරාගත් පුපුරණ රසායනික ද්‍රව්‍ය




## තීරු බදු රහිත වෙළඳසැල

විදේශිකයන් සඳහා වූ තීරුබදු රහිත ප්‍රදර්ශනාගාරය

# ව්‍යාපාර සමාලෝචනය

## විකුණුම් වර්ධනය (රු. මිලියන)




## ආදායම් බදුවලට පසු ශුද්ධ ලාභය (රු. මිලියන)



# දීපව්‍යාප්ත ශාඛා ජාලය



# රැකියා උත්පාදනය

## 2010 - 2015

රැකියා උත්පාදනය 2010/2011 සිට 2014/2015 දක්වා

| | මුළු සේවක සංඛ්‍යාව | සෘජුව සම්බන්ධ වන සේවකයින් | වෙළඳ සේවකයින |
|---|---|---|---|
| 2010-2011 | 290 | 137 | 153 |
| 2011-2012 | 314 | 158 | 156 |
| 2012-2013 | 318 | 158 | 160 |
| 2013-2014 | 392 | 214 | 178 |
| 2014-2015 | 395 | 208 | 187 |

# e- සේවා සැපයුම් පද්ධතිය

## ව්‍යාපාර සම්පත් මෘදුකාංගයේ විශේෂ ලක්ෂණ

තොග, සැපයුම් සේවා, මානව සම්පත්, පාරිභෝගික සම්බන්ධතා කළමණාකරණය යනාදී බොහෝ පුළුල් වූ හැකියාවන් ලබාදෙමින් ව්‍යාපාර සම්පත් සැලසුම් මෘදුකාංගය සමස්ථ ව්‍යාපාරයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වර්ධනය කරනු ලබයි.




## ERP මෘදුකාංගය මඟින් STC ආයතනයට හිමි වී ඇති ප්‍රතිලාභයන්

- ආයතනයේ ව්‍යාපාර කටයුතු ස්වයංක්‍රීයව සිදුකිරීම තුලින් විකුණුම් සහ මෙහෙයුම් සඳහා අනගි සහයක් ලැබී ඇත. (ඉන්වොයිස්, මිලදී ගැනීමේ ඇනවුම්, අපේක්ෂිත ඉදිරි සැලසුම් සකස් කිරීමේ තිබූ අපහසුතා මගහැරීම).
- මෙහෙයුම් කටයුතු සිදුකිරීමේදී ඇතිවන අත්වැරදීම් වැලකීම.
- තීරනාත්මක කළමණාකරන තීරණ වලට එලඹීමේදී විශාල සහයක් ලබාදීම.
- ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහයෝගීව ක්‍රියාකිරීමේ පැහැදිලි පුළුල් දර්ශනයක් අවශ්‍ය වනු ඇත. එයට අවශ්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ සංඛ්‍යාන දත්ත ගණනය කොට ව්‍යාපාරයේ තීරණ වලට එලඹීම සඳහා දත්ත ලබාගැනීමේ පහසුව.
- ව්‍යාපාර කටයුතු වලදී සහ ප්‍රසම්පාදන කටයුතු වලදී පාරිභෝගික අවශ්‍යතා හඳුනාගෙන කේන්ද්‍රීය මිලදී ගැනීමේ ආකෘතියක් භාවිතා කොට මෙමගින් අනවශ්‍ය වියදම් සහ නීත්‍යානුකූල බලයක් නොමැති අනවසර පුද්ගලයන්ගේ ග්‍රහනයට පද්ධතිය නතු වීම වැලකීම.
- පාරිභෝගික සංතෘප්තිය වැඩිකිරීම සඳහා මෙම පද්ධතිය උපයෝගී වී ඇති අතර අදාල කාල සීමාව තුලදී වෙළඳ භාණ්ඩ හා සේවා නිසියාකාරයෙන් පාරිභෝගිකයන් හට ලබාදීම සඳහා මෙම පද්ධතිය ඉවහල්වී  ඇතිබව පාරිභෝගික ධනාත්මක ප්‍රතිචාර මඟින් තහවුරු වී ඇත .
- විශ්ලේෂණාත්මක වාර්තා ජනනය කිරීම තුලින් ආයතනයේ සම්පත් නිසියාකාරයෙන් කළමණාකරනය කොට නාස්තිය මගහැරීමට ඉවහල් වීම.
- සියළුම ව්‍යාපාර අංශ මෙම පද්ධතිය මඟින් නිසියාකාරයෙන් කළමණාකරනය කිරීම තුලින් ඉතා පහසුවෙන් ව්‍යාපාර තීරන වලට එලඹීමට හැකි වීම.
- ආයතනය බාහිර පාර්ශව සමඟ ව්‍යාපාර කටයුතු වල නිරත වීමේදී විනිවිද භාවයකින් යුතුව තොරතුරු හුවමාරුකර ගන්නා අතර මේ සඳහා ආයතනය තුල පවතින ඵලදායී වාර්තාකරන ක්‍රියාවලිය තවත් ඉදිරියට රැගෙන යාමට මෙම මෙහෙයුම් පද්ධතිය සමත්විය.
- මෙහෙයුම් පද්ධතිය සකස් වී ඇත්තේ දත්තයන්ගේ ආරක්ෂාව සිදුවන ආකාරයට වන අතර ආයතනය පුළුල් වීමේදී මෙමඟින් අනගි සහයක් ලැබී ඇත .
- නිරන්තරයෙන් වෙනස්වන ව්‍යාපාර සහ තාක්ෂණික ලෝකයට ආයතනය හැඩගැන්වීම සඳහා මෙහෙයුම් පද්ධතිය අනගි වේදිකාවක් වී ඇත.

## සංස්ථාපිත පිලිගත් සම්මතයන්

පසුගිය වර්ෂය තුල දී STC අධ්‍යකෂ මණ්ඩලය සහ කළමණාකාරීත්වය ඉමහත් කැපවීමකින් සහ ධෛර්යකින් යුතුව ආයතන පාලනය යහපත් අයුරින් පවත්වාගෙන ගොස් ඇත. මීට අමතරව STC ආයතනය සතුව සුදුසුකම්ලත් ගණකාධිකාරී වරියකගෙන් සම්පූර්ණ වූ අභ්‍යන්තර විගණන අංශයක් ඇති අතර එමගින් අභ්‍යන්තර පාලනයේ නිරවද්‍ය භාවය තහවුරු කිරීම සහ යහපත් පාලන පරිසරයක් පවත්වාගෙන යාම සිදුකරයි. තවද විගණන කමිටුවක් මගින් අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සහ ක්‍රියාකාරීතවය අධ්‍යකෂ මණ්ඩලයට වාර්තා කරනු ලබයි.

## අධ්‍යක්ෂ මණ්ඩලය

ප්‍රදීප් ගුණවර්ධන මහතා
සභාපති/කළමණාකාර අධ්‍යක්ෂක

බී.එම්.සී.කේ.බස්නායක මහතා
ක්‍රියාකාරි අධ්‍යක්ෂක

රංජිත් කල්දේරා මහතා
අධ්‍යක්ෂක

එස්.ඒ.සී. කුලතිලක මහත්මිය
අධ්‍යක්ෂක

පි.එම්.පෙරේරා මහත්මිය
අධ්‍යක්ෂක

ඊ එල් රාජපක්ෂ මහතා
අධ්‍යක්ෂක

## විගණන කමිටුව

එස්.ඒ.සී. කුලතිලක මිය
කමිටු සභාපති

රංජිත් කල්දේරා මහතා
අධ්‍යක්ෂක

පී.එම්.පෙරේරා
අධ්‍යක්ෂක

ඊ එල් රාජපක්ෂ මහතා
අධ්‍යක්ෂක

## භාවිතා කරනුලබන ව්‍යාපාර කළමණාකරන මෙවලම්

1) ආයතනික සැලසුම් 2011/12-2015/16

2) වාර්ෂික වාර්ථාව 2014/15

3) එස්.ටී.සි. ප්‍රසම්පාදන විධිවිධාන

4) එස්.ටී.සී. ක්‍රියාකාරී සැලැසුම

5) එස්.ටී.සී. භාණ්ඩ නාමාවලිය

6) එස්.ටී.සී. නාමාවලිය

7) එස්.ටී.සී. වෙළද ණය පිළිබද විධිවිධාන



# මූල්‍ය කාර්යසාධනය

| | 2014/2015 (Rs. 000's) | 2013/2014 (Rs. 000's) | වෙනස (%) |
|---|---|---|---|
| **මෙහෙයුම්** | | | |
| පිරිවැටුම | 3,861,940 | 3,052,009 | 21% |
| පොළී සහ බදු වලින් පසු මෙහෙයුම් ඉපැයුම | 45,464 | 81,216 | -79% |
| බදු පෙර ලාභය | 10,594 | 74,094 | -599% |
| බදු පසු ලාභය | 9,302 | 46,041 | -395% |
| **ශේෂ පත්‍රය** | | | |
| ජංගම නොවන වත්කම් | 589,301 | 460,722 | 22% |
| ජංගම වත්කම් | 2,461,894 | 1,814,105 | 26% |
| ජංගම වගකීම් | 2,308,233 | 1,540,613 | 33% |
| ජංගම නොවන වගකීම් | 47,997 | 48,550 | -1% |
| ප්‍රකාශ කල ප්‍රාග්ධනය හා සංචිත | 694,966 | 685,664 | 1% |
| **මුදල් ප්‍රවාහ** | | | |
| මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | (233,159) | 438,725 | 288% |
| මෙහෙයුම් කටයුතු සඳහා භාවිතයට ගත් මුදල් ප්‍රවාහය | (247,768) | 403,115 | 26% |
| ආයෝජන සඳහා යෙදවූ මුදල් | (130,140) | (135,798) | -4% |
| මූල්‍ය ප්‍රතිපාදන සඳහා යෙදවූ මුදල | (263,393) | (382,273) | -45% |
| **කොටසක තොරතුරු** | | | |
| කොටසක ඉපැයුම | 1.54 | 5.07 | -299% |
| කොටසක ශුද්ධ වත්කම් | 69.50 | 68.57 | 1% |
| **වැදගත් මූල්‍ය අනුපාත** | | | |
| දළ ලාභ අනුපාතය | 16% | 16% | -- |
| ශුද්ධ ලාභ අනුපාතය | 0.27% | 2.43% | -785% |
| ක්ෂණික අනුපාතය | 0.68 | 0.83 | -21% |
| ජංගම අනුපාතය | 1.07 | 1.18 | -10% |
| ද්‍රවශීලතා අනුපාතය | 0.52 | 1.10 | -112% |
| හිමිකම් මත ප්‍රතිලාභය | 0.01 | 0.07 | -423% |
| වත්කම් මත ප්‍රතිලාභය | 0.003 | 0.02 | -473% |

# ප්‍රස්ථාරික නිරූපනය

## පිරිවැටුම (රු. මිලියන)

| වර්ෂය | පිරිවැටුම (රු. මිලියන) |
|---|---|
| 05/06 | 367 |
| 06/07 | 244 |
| 07/08 | 321 |
| 08/09 | 509 |
| 09/10 | 875 |
| 10/11 | 1,093 |
| 11/12 | 1,872 |
| 12/13 | 2,269 |
| 13/14 | 3,052 |
| 14/15 | 3,862 |




## බදු පෙර ලාභය (රු. මිලියන)

| වර්ෂය | බදු පෙර ලාභය (රු. මිලියන) |
|---|---|
| 05/06 | (29) |
| 06/07 | (58) |
| 07/08 | 4 |
| 08/09 | 28 |
| 09/10 | 52 |
| 10/11 | 59 |
| 11/12 | 82 |
| 12/13 | 97 |
| 13/14 | 74 |
| 14/15 | 11 |




## මුළු වත්කම් (රු. මිලියන)

| වර්ෂය | මුළු වත්කම් (රු. මිලියන) |
|---|---|
| 05/06 | 450 |
| 06/07 | 538 |
| 07/08 | 530 |
| 08/09 | 600 |
| 09/10 | 2,639 |
| 10/11 | 2,028 |
| 11/12 | 2,469 |
| 12/13 | 2,059 |
| 13/14 | 2,275 |
| 14/15 | 3,051 |



# ප්‍රස්ථාරික නිරූපනය

| වර්ෂය | ශුද්ධ වත්කම් (රු. මිලියන) |
|---|---|
| 05/06 | 238 |
| 06/07 | 349 |
| 07/08 | 352 |
| 08/09 | 372 |
| 09/10 | 441 |
| 10/11 | 484 |
| 11/12 | 572 |
| 12/13 | 640 |
| 13/14 | 686 |
| 14/15 | 695 |

## ශුද්ධ වත්කම් (රු. මිලියන)




| වර්ෂය | කොටසක ඉපයුම් (රු. මිලියන) |
|---|---|
| 05/06 | (2.90) |
| 06/07 | (5.83) |
| 07/08 | 0.36 |
| 08/09 | 1.94 |
| 09/10 | 4.84 |
| 10/11 | 4.36 |
| 11/12 | 6.32 |
| 12/13 | 6.69 |
| 13/14 | 5.07 |
| 14/15 | 1.54 |

## කොටසක ඉපයුම් (රු. මිලියන)




| වර්ෂය | ආයෝජිත ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය (රු. මිලියන) |
|---|---|
| 05/06 | -10.98% |
| 06/07 | -15.98% |
| 07/08 | 1.10% |
| 08/09 | 4.77% |
| 09/10 | 11.08% |
| 10/11 | 13.00% |
| 11/12 | 19.05% |
| 12/13 | 13.21% |
| 13/14 | 11.06% |
| 14/15 | 6.12% |

## ආයෝජිත ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය (%)



# විකුණුම් ආදායම් ප්‍රස්ථාරික නිරූපණය

## 2000/2001 සිට 2014/2015



## වෙළඳ අංශ ප්‍රගතිය 2014/ 2015

# ආදායම් උත්පාදක




| අංශය | | ආදායම රු. |
|---|---|---|
| රසායනික ද්‍රව්‍ය | CA | 708,516,471.00 |
| තොරතුරු තාක්ෂණ අංශය | ICT | 615,724,919.00 |
| කාර්යාලීය උපකරණ | OS | 419,423,462.00 |
| මෝටර් රථ අංශය | AP | 214,639,899.00 |
| තීරු බදු රහිත වෙළඳ ප්‍රදර්ශනාගාරය | DFS | 307,089,572.00 |
| විද්‍යුත් සහ විදුලි උපකරණ | ELDV | 304,034,685.00 |
| විශේෂ ව්‍යාපෘති අංශය | SPU | 266,433,079.00 |
| ගෘහ උපකරණ | HR | 300,182,510.00 |
| ඉදිකිරීම් ද්‍රව්‍ය | CH | 493,743,644.00 |
| වෙනත් | UA | 232,151,514.00 |
| | | 3,861,939,755.00 |

**Dayananda Samarawickrema & Co.,**
CHARTERED ACCOUNTANTS

**Partners**
H.G. Dayananda F.C.A.
J. Rajasuriya F.C.A., B.A.
P.D.G. Ravinatha A.C.A.
K.G. Chandana Kumara A.C.A.

No. 20/26, Station Lane,
Nugegoda, Sri Lanka.
Tele : 2854614, 2809650, 2822940
Fax : 2820112
E mail : dsandco@sltnet.lk

## ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

සී/ස ශ්‍රීලංකා රජයේ වාණජ (විවිධ) නීතිගත සංසථාවේ කොටස් හිමියන් වෙත,

### මූල්‍ය ප්‍රකාශන මත වාර්ථාව

අප විසින් සී/ස ශ්‍රී ලංකා රජයේ වාණජ (විවිධ) නීතිගත සංසථාවේ 2015/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, ආදායම් ප්‍රකාශය, වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණම්කරණ ප්‍රතිපත්තීන් වල සාරාංශය හා අනෙකුත් ලබාදී ඇති විස්තරාත්මක සටහන් විගණනය කර ඇත.

මූල්‍ය වාර්ථා සඳහා වන කළමණාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා ගිණිම්කරණ ප්‍රමිතවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකම කළමනාකරණය සතුවේ. මෙම වගකීම යටතට සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා මූල්‍ය වාර්ථා ප්‍රමාණාත්මක වැරදි හා අඩපාඩු වලින් තොරව පිළියෙල කිරීම හා සාධාරණව ඉදිරිපත් කිරීම, සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරාගැනීම හා භාවිතා කිරීම සහ සාධාරණව ගිණුම්කරණ ඇස්තමේන්තු සැකසීම අයත්වේ.

### විගණනයේ විෂය පථය සහ විගණන මතය සඳහා පදනම

අපගේ වගකීම වන්නේ අපගේ විගණනයට අනුව මූල්‍ය ප්‍රකාශන මත මතයක් ප්‍රකාශ කිරීමයි. අපි විගණනය සිදුකළේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට අනුකූලවයි. එම විගණන ප්‍රමිතීන්ට අනුකූලව අප මූල්‍ය වාර්ථාවන් ප්‍රමාණාත්මක වැරදි හා අඩුපාඩු වලින් තොර බවට සාධාරණ සහතිකවීමක් ලබා ගැනීම සඳහා විගණනය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී.

වටිනාකම් තහවරු කරන සාක්ෂි නියැදි පදනම මත විමසීම, පරීක්ෂා කිරීම හා මූලික හෙළිදරවු කිරීම විගණනයට ඇතුළත් වේ. එමෙන්ම විගණනයක අන්තර්ගතයට යොදාගත් ගිණුම්කරණ සංකල්පයන්, කළමනාකරණය විසින් යොදාගන්නා ලද වැදගත් ගිණම්කරණ ඇස්තමේන්තු මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල පවතින ඉදිරිපත් කිරීම් සහ ඇගයීම් මෙයට ඇතුළත් වේ.

අපගේ විගණන සඳහා අප විසින් අපගේ දැනුමට අනුව අවශ්‍ය සියලුම තොරතුරු හා පැහැදිලිකිරීම් ලබාගෙන ඇත. එමගින් අපගේ මතය ප්‍රකාශ කිරීමට සාධාරණ පදනමක් අපගේ විගණනය මගින් සපයන බව අප විශ්වාස කරයි.

### මතය

අපගේ විගණන මතය අනුව සමාගම විසින් 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ගිණුම් වාර්ථා විධිමත්ව පවතවාගෙන ගොස් ඇත. එබැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සමාගමේ මූල්‍ය වාර්ථා වලින් 2015 මාර්තු 31 වැනි දිනට සමාගමේ තත්වය හා ලාභය පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්වයක් පෙන්නුම් කරයි.

නීතිමය සහ නියාමන වාර්තාව

අපගේ මතය අනුව ඉහත සඳහන් මූල්‍ය වාර්ථා 2007 අංක 7 දරණ සමාගම් පනතේ වගන්ති 151 (2) හි අවශ්‍යතා වලට අනුකූලව සකස්කර ඇත

Dayananda Samarawickrema & Co.
No. 20/26
Station Lane,
Nugegoda.
Chartered Accountants

ඔබගේ හිතවත්

දයානන්ද සමරවික්‍රම සහ සමාගම

වරලත් ගණකාධිකාරීවරු

10.11.2015

# මුළු ආදායම් ප්‍රකාශය

2015 මාර්තු 31 න් අවසන් වසර සඳහා

| | සටහන | 2014/2015 | 2013/2014 |
|---|---|---|---|
| | | රු. ශත | රු. ශත |
| ආදායම | 03 | 3,861,939,755 | 3,052,008,860 |
| විකුණුම් පිරිවැය | | (3,242,781,217) | (2,551,877,551) |
| දළ ලාභය | | 619,158,538 | 500,131,309 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 04 | 4,786,720 | 14,327,232 |
| | | 623,945,258 | 514,458,541 |
| බෙදාහැරීමේ වියදම් | 05 | (183,678,919) | (144,242,207) |
| පරිපාලන වියදම් | 06 | (388,659,957) | (284,352,722) |
| | | (572,338,876) | (428,594,929) |
| පොළී හා බදු පෙර ඉපැයීම් | | 51,606,382 | 85,863,612 |
| ශුද්ධ මූල්‍ය ආදායම/(වියදම) | 07 | (34,870,457) | (7,122,146) |
| බදු පෙර ලාභය | | 16,735,925 | 78,741,466 |
| ආදායම් බදු | 08 | (1,291,720) | (28,053,788) |
| ශුද්ධ වාර්ෂික ලාභය | | 15,444,205 | 50,687,678 |
| අනෙකුත් විස්තීරණ ආදායම් | | | |
| සත්‍ය ලාභය/අලාභය සේවාදායක ප්‍රතිලාභ මත | 18 | (6,142,412) | (4,646,910) |
| අනෙකුත් විස්තීරණ ආදායම් එකතුව | | (6,142,412) | (4,646,910) |
| වාර්ෂික ශුද්ධ ආදායම | | 9,301,793 | 46,040,798 |
| කොටසක් සඳහා මූලික ඉපැයුම | 09 | 1.54 | 5.07 |

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයේ මූලික කොටස් බව සලකන්න.

වරහන් තුල දක්වා ඇති සංඛ්‍යාත්මක අගයන් ඍණ අගයන් බව සලකන්න.

# මූල්‍ය තත්ව ප්‍රකාශය (ශේෂ පත්‍රය)

2015 මාර්තු 31 දිනට

| වත්කම් | සටහන | 2014/2015<br>රු. ශත | 2013/2014<br>රු. ශත |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල පිරියත උපකරණ | 10 | 575,891,758 | 454,192,835 |
| ආයෝජන | 11 | 20 | 20 |
| සේවක ණය | 12A | 6,772,154 | 6,428,986 |
| පහසු ගෙවීමේ ණය යෝජනා ක්‍රමය - ජංගම නොවන | 12B | 6,637,387 | 100,652 |
| මුළු ජංගම නොවන වත්කම් | | 589,301,319 | 460,722,493 |
| ජංගම වත්කම් | | | |
| තොග | 13 | 892,186,552 | 541,5 87,127 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 14 | 780,172,146 | 593,003,243 |
| සේවක ණය - වර්ෂයක් ඇතුලත | 12A | 3,734,955 | 3,564,287 |
| පහසුගෙවීමේ ණය යෝජනා ක්‍රමය - ජංගම | 12B | 4,071,777 | 35,824 |
| ආනයනික සහල් සහනාධාර | 15 | 396,625,946 | 324,164,384 |
| කෙටි කාලීන ආයෝජන (ස්ථිර තැන්පත්) | | 358,773,901 | 333,655,365 |
| මුදල් හා මුදල් සමාන දෑ | 16 | 26,329,105 | 18,094,798 |
| | | 2,461,894,422 | 1,814,105,028 |
| මුළු වත්කම් | | 3,051,195,741 | 2,274,827,521 |
| ස්කන්ධය හා වගකීම | | | |
| ප්‍රාග්ධනය හා සංචිත | | | |
| ප්‍රකාශ කල ප්‍රාග්ධනය (රු 10 සාමාන්‍ය කොටස් මිලියන 10) | | 100,000,000 | 100,000,000 |
| පොදු සංචිත | | 45,607,646 | 45,607,646 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 241,108,234 | 241,108,236 |
| අනෙකුත් සංචිත | | (14,124,651) | (7,982,239) |
| ප්‍රත්‍යාගණන සංචිත රඳවා ගත් ඉපැයීම් | | 322,374,838 | 306,930,633 |
| මුළු ස්කන්ධය | | 694,966,067 | 685,664,276 |
| ජංගම නොවන වගකීම් | | | |
| පොළී ගෙවන වගකීම් | 17 | 17,298,486 | 20,769,568 |
| විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් | 18 | 34,477,390 | 24,976,576 |
| ශුද්ධ විලම්භිත බදු වගකීම්(වත්කම්) | 19 | (3,779,279) | 2,803,745 |
| | | 47,996,597 | 48,549,889 |
| ජංගම වගකීම් | | | |
| ගෙවිය යුතු ආදායම් බදු | | 4,636,880 | 11,046,128 |
| කෙටි කාලීන ණය | 20 | 970,148,971 | 613,112,241 |
| පොළී ගෙවන වගකීම් | 17 | 6,947,767 | 6,029,870 |
| වෙළඳ සහ වෙනත් ණය හිමියෝ | 21 | 980,851,254 | 687,526,945 |
| බැංකු අයිරාව | 22 | 345,648,205 | 222,898,172 |
| | | 2,308,233,077 | 1,540,613,356 |
| මුළු ස්කන්ධය හා වගකීම් | | 3,051,195,741 | 2,274,827,521 |

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයේ මූලික කොටස් බව සලකන්න.

වරහන් තුල දක්වා ඇති සංඛ්‍යාත්මක අගයන් ඍණ අගයන් බව සලකන්න.

ඉහත මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතට අනුකූලව සකසා ඇත.

.............................................

මුදල් කළමණාකාර

අධ්‍යක්ෂක මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශ වල ඉදිරිපත් කිරීමට සහ ඒ සම්බන්ධයෙන් වගකීම භාරගනු ලබයි.

.............................................                .............................................

සභාපති /කළමණාකාරන අධක්ෂක                අධ්‍යක්ෂක

# හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය

2015 මාර්තු 31න් අවසන් වූ වසර සඳහා

| | ප්‍රකාශ කල ප්‍රාග්ධනය<br>රු. ශත | ප්‍රත්‍යාගණන සංචිත<br>රු. ශත | පොදු සංචිත<br>රු. ශත | අනෙකුත් සංචිත<br>රු. ශත | රඳවාගත් ලාභ/අලාභ<br>රු. ශත | එකතුව<br>රු. ශත |
|---|---|---|---|---|---|---|
| 2013 අප්‍රේල් 01 දිනට ශේෂය | 100,000,000 | 45,607,646 | 241,108,236 | (3,335,329) | 256,242,961 | 639,623,514 |
| වසර සඳහා ලාභය/අලාභය | - | - | - | - | 50,687,672 | 50,687,672 |
| සත්‍ය ලාභය/අලාභය සේවාදායක ප්‍රතිලාභ මත | | | | (4,646,910) | | (4,646,910) |
| 2014 මාර්තු 31 දිනට ශේෂය | 100,000,000 | 45,607,646 | 241,108,236 | (7,982,239) | 306,930,633 | 685,664,276 |
| 2014 අප්‍රේල් 01 දිනට ශේෂය | 100,000,000 | 45,607,646 | 241,108,236 | (7,982,239) | 306,930,633 | 685,664,276 |
| වසර සඳහා ලාභය/අලාභය | - | - | - | - | 15,444,205 | 15,444,205 |
| සත්‍ය ලාභය/අලාභය සේවාදායක ප්‍රතිලාභ මත | | | | (6,142,412) | | (6,142,412) |
| 2015 මාර්තු 31 දිනට ශේෂය | 100,000,000 | 45,607,646 | 241,108,234 | (14,124,651) | 322,374,838 | 694,966,069 |

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයේ මූලික කොටස් බව සලකන්න.

වරහන් තුල දක්වා ඇති සංඛ්‍යාත්මක අගයන් සෘණ අගයන් බව සලකන්න.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

## 2015 මාර්තු 31න් අවසන් වූ වසර සඳහා

| | 2014/2015<br>රු. ශත | 2013/2014<br>රු. ශත |
|---|---|---|
| මෙහෙයුම් කටයුතු වලදී ලද මුදල් ප්‍රවාහය | | |
| බදු පෙර ශුද්ධ ලාභය | 16,735,925 | 78,741,461 |
| ගැලපීම | | |
| ලීසිං පොළිය | 5,092,728 | 3,653,163 |
| ක්ෂය වීම් / ක්‍රමක්ෂය | 43,004,936 | 29,424,115 |
| පොළී ආදායම | (27,351,677) | (38,828,826) |
| කෙටිකාලීන ණය හා බැංකු අයිරා පොළී | 57,129,406 | 42,297,808 |
| වෙළඳ ණය ගැතියන්ගෙන් බොල් හා අඩමාන ණය වෙන් කිරීම | - | (1,713,471) |
| පාරිතෝෂිත සඳහා වෙන් කිරීම | 3,358,401 | 2,488,333 |
| ප්‍රාග්ධන වෙනස්කම් වලින් පසු මෙහෙයුම් ලාභය | 97,969,746 | 116,062,583 |
| තොග වැඩි වීම/අඩු වීම | (350,599,425) | (171,566,157) |
| වෙළඳ ණයගැතියෝ සහ අනිකුත් ලැබිය යුතු දෑ වැඩි/අඩුවීම් | (191,144,652) | (220,558,244) |
| ආනයනික සහල් සහනාධාර ලැබීම (වැ/අ) | (72,461,562) | 378,071,981 |
| පහසු ගෙවීමේ ණය වැඩි/අඩුවීම් | (10,572,687) | (136,476) |
| වෙනත් ගෙවීම් වැඩි වීම/අඩු වීම | 293,649,469 | 336,851,043 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ලද මුදල් ප්‍රවාහය | (233,159,111) | 438,724,730 |
| ගෙවු රඳවා ගැනීමේ බදු | (3,248,015) | (3,588,109) |
| ගෙවූ ආදායම් බදු | (11,361,138) | (30,906,976) |
| ගෙවූ පාරිතෝෂිකය | - | (1,114,476) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | (247,768,265) | 403,115,169 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| දේපල,පිරියත සහ උපකරණ මිලදී ගැනීම් | (61,358,159) | (35,460,081) |
| ප්‍රාග්ධන නොනිම් වැඩ සදහා ආයෝජනය | (99,595,727) | (137,349,785) |
| ලද පොළිය | 30,813,550 | 37,012,016 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | (130,140,336) | (135,797,850) |
| මූල්‍ය කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහය | | |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | (25,118,536) | (32,267,092) |
| ශුද්ධ ණය උත්පාදනය | 357,036,730 | (298,145,333) |
| ණය ආපසු ගෙවීම් සහ බැංකු අයිරා පොළී ගෙවීම් | (57,129,406) | (42,297,808) |
| ලීසිං වාරික ගෙවීම් | (11,395,913) | (9,563,132) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | 263,392,875 | (382,273,365) |
| ශුද්ධ වර්ධනය / පිරිහීම සහ මුදල් වලට සමාන දෑ | (114,515,726) | (114,956,046) |
| වසර මුල මුදල් සහ මුදල් වලට සමාන දෑ | (204,803,374) | (89,847,328) |
| වර්ෂ අවසානයේ මුදල් සහ මුදල වලට සමාන දෑ- (සටහන - අ) | (319,319,100) | (204,803,374) |

| සටහන අ ) - මුදල් සහ මුදල් වලට සමාන දෑ ගෙනහැර දැක්වීම | **31,03,2015**<br>රු. ශත | **31,03,2014**<br>රු. ශත |
|---|---|---|
| බැංකු මුදල් | | |
| ලංකා බැංකුව ගිණුම් අංක 008859546 | 1,067,338 | 1,180,170 |
| සම්පත් බැංකුව ගිණුම් අංක 000930000337 | 2,372,943 | 204,498 |
| සම්පත් බැංකුව ගිණුම් අංක 002930006974 | | |
| (තීරු බදු රහිත) | 4,274,052 | 4,255,737 |
| ලංකා බැංකුව ගිණුම් අංක 1060 | | |
| NDB බැංකුව :ගිණුම් අංක - 106340003864 | 20,847 | 21,847 |
| මහජන බැංකුව ගිණුම් අංක 032100160037019 | 2,033,634 | 1,089,588 |
| මහජන බැංකුව ගිණුම් අංක 226100100206579 | 1,264,897 | - |
| | 130,406 | - |
| අතැති මුදල් | | |
| සුළු මුදල් ආශ්‍රිමය | 415,316 | 341,830 |
| අතැති මුදල් | 14,749,672 | 11,001,128 |
| බැංකු අයිරාව | | |
| මහජන බැංකුව ගිණුම් අංක - 004100120210918 | (339,041,284) | (222,242,040) |
| මහජන බැංකුව ගිණුම් අංක - 003100190206579 | (1,241,135) | - |
| NDB බැංකුව :ගිණුම් අංක - 101000160408 | (5,365,786) | (656,131) |
| | (319,319,100) | (204,803,374) |

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයේ මූලික කොටස් බව සලකන්න.
වරහන් තුල දක්වා ඇති සංඛ්‍යාත්මක අගයන් ඍණ අගයන් බව සලකන්න.

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

1. පොදු විස්තරය

සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කොට ඇත.

මෙහි ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය අංක 100, නවම් මාවත, කොළඹ 02 යන ස්ථානයේ සිය ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබයි.

ආයතනයේ ප්‍රධාන කර්තව්‍ය මෙහෙයුම් වෙළඳාම හා ප්‍රතිසම්පාදන කටයුතු වන අතර රාජ්‍ය අංශයේ ප්‍රධාන සැපයුම් කරුවෙකු ලෙස ද ආයතනය ක්‍රියා කරනු ලබයි.

2015 මාර්තු 31 වන දිනට ආයතනික ශ්‍රම බලකාය 395 කි.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශය

2.1 පිළියෙළ කිරීමේ පදනම

2.1.1 අනුගතවීමේ ප්‍රකාශනය

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ නව ප්‍රමිතීන්ට අනුකූලව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියාමයන්ට අනුකූල වන අයුරින් සකස් කොට ඉදිරිපත් කර ඇත.

2015 නොවැම්බර් මස 10 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම මූල්‍ය ප්‍රකාශනය සඳහා අනුමැතිය හිමි විය.

2.1.2 ඉදිරිපත් කිරීමේ පදනම

පහත දැක්වෙන අයිතමයන් හැර අනෙකුත් සියළුම අයිතම ගෙනහැර දක්වා ඇත්තේ "ඓතිහාසික පිරිවැය පදනම" පදනම් කර ගනිමිනි.

අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හි අංක 19 ට අනුව, විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම වර්ථමාන අගයට පෙන්වා ඇත්තේ ප්‍රක්ෂිප්ත ඒකක ණය ක්‍රමය පදනම් කර ගනිමිනි.

ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය සමාගම් කටයුතු අධීක්ෂණයෙන් පසුව ආයතනයේ කටයුතු අනාගත කාල පරිච්ඡේදයක් සඳහා කරගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගම සතු බව තහවුරු කර ඇත. එම නිසා අඛණ්ඩ පැවැත්ම නැමති සංකල්පය මූල්‍ය ප්‍රකාශ ප්‍රකාශයට පත් කිරීමේදී සැලකිල්ලට ගෙන ඇත.

2.1.3 සංසන්දනාත්මක විශ්ලේෂණය

පසුගිය වසර වල මූල්‍ය ප්‍රකාශන වල අදාල ශේෂයන් ජංගම වර්ෂයේ ඉදිරිපත් කිරීම් වලින් සනාථ කිරීම සඳහා අවශ්‍ය විටදී නැවත වර්ගීකරණය කොට දක්වා ඇත.

2.1.4 ඇස්තමේන්තු සහ තීරණාත්මක ගිණුම්කරණ විනිශ්චයන් භාවිතය

මූල්‍ය ප්‍රකාශන අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුව පිළියෙල කිරීමේදී කළමණාකාරීත්වය විනිශ්චයන්,ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතයට ගෙන ඇති අතර මෙමගින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් කෙරෙහි සෘජු බලපෑමක් ඇති අවස්ථාවන්හිදී ප්‍රකෘශයට පත් කරන ප්‍රකාශන සැබෑ තත්වයට වෙනස් විය හැකිය.

මෙම ඇස්තමේන්තු සහ උපකල්පන වාර්ෂිකව කළමණාකාරීත්වයේ සමාලෝචනයට පත්වන අතර එම අවස්ථාවන්හිදී ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සිදුකරන ලද ප්‍රතිශෝධන අදාල ගිණුම් වර්ෂයේ හදුනා ගැනීම සහ එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීම,සහ ඉදිරි ගිණුම් වර්ෂ වල මූල්‍ය ප්‍රකාශන වලට ගනු ලබයි .

සටහන් අංක 18 - ගිණුම් කිරීමේ නිශ්චිත විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම.

මූල්‍ය ප්‍රකාශන සඳහා බලපාන උද්ධමනකාරී සාධක වලට ගැපපීම් සිදුකර නොමැත.

වැදගත් සහ සුදුසු ප්‍රතිපත්තීන් ඉදිරි සටහන්වල ඉදිරිපත් කර ඇත.

2.1.5 විදේශීය මුදල් ගණුදෙනු පරිවර්ථනය

අ) ඉදිරිපත් කොට භාවිතයේ ඇති සහ ක්‍රියාකාරී මුදල් ඒකකය

විදේශ මුදල් ගණුදෙනු ගිණුම්ගත කිරීමේදී අදාල ගණුදෙනුව සිදුවූ දිනට පැවති විදේශීය හුවමාරු අනුපාතය පදනම් කර ගනු ලබයි. අදාල ගණුදෙනු පියවීමේදී ඇති වූ ලාභ හෝ අලාභ පරිවර්ථනය කර ඇත්තේ වසර අවසානයේ පැවති හුවමාරු අනුපාතයන්ට අනුවයි. ආයතනයේ ගිණුම් පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි, මෙය ශ්‍රී ලංකාව තුල ක්‍රියාකාරිත්වය දරණ මුදල් ඒකකය වේ.

ආ) ගණුදෙනු සහ ශේෂයන්

විදේශ මුදල් ගණුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කිරීමේදී අදාල දිනට පැවති විනිමය අනුපාතය අනුව ගලපා ගිණුම් වල දක්වා ඇත.

2.2 වත්කම් සහ ඒවායේ වටිනාකම තක්සේරු කිරීමේ පදනම.

2.2.1 දේපල,පිරියත සහ උපකරණ

2.2.2 හදුනාගැනීම සහ මිණුම්කිරීම

ආයතනය විසින් ගොඩනගා ගත් වත්කම් වල අගය පෙන්වා ඇත්තේ ඒ වෙනුවෙන් දරණ ලද අමු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය සහ දරන ලද අනෙකුත් සෘජු වියදම් ද ඇතුලත්ව එම වත්කම් භාවිතයට ගත හැකි වන ආකාරයට පත් කර ගැනීමට දැරූ සියළු පිරිවැය ඇතුලත් අගයට වේ.

කිසියම් දේපල,පිරියත,උපකරණ වර්ෂ කිහිපයකදී මිලට ගත් වත්කම් නම් එහි ඵලදායී ජිවකාලය බෙදා දැක්විම කල යුත්තේ ප්‍රධාන සංඝටක වල පැවැත්ම පදනම් කර ගනිමිනි.

දේපල,පිරියත,උපකරණවල සමුච්චිත ක්ෂය අගය අඩුකල පසු අගය වාර්ෂික සමාලෝචනයට ලක්වන අතර කිසියම් වෙනස්කමක් සිදු වූව හොත් එම වෙනස්කමට අදාල පිරිවැය මත වූ ක්ෂය අගය අඩු කිරීමෙන් අනතුරුව එය ගෙන හැර දැක්වේ. එම ක්ෂය කල අගය අඩුකර නොහැකි අවස්ථාවලදී එම වත්කම මත වූ ක්ෂය ලියා හැර ඉන්පසු ඉතිරි වන අගය එම දේපල,එසේ නැත්නම් පිරියත,උපකරණ පොත් අගය ලෙස ගෙන හැර දක්වනු ලැබේ.

ඉඩම් හා ගොඩනැගිලි 2006 දී සිදුකල ප්‍රත්‍යාගණන පදනම මත ගිණුම් ගත කර ඇත .කෙසේ වෙතත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව නැවත ප්‍රත්‍යාගණනය කලයුතු වූවත් එසේ කිරීමෙන් ධනාත්මක ප්‍රථිලාභ සිදුනොවේ නම් එසේ නොකිරීමෙන් මූල්‍ය ප්‍රමිතීන්ට කිසිදු අහිතකර බලපැමක් සිදුනොවේ.

දේපල පිරියත හා උපකරණ වල සමච්චිත ක්‍ෂය අගය අඩුකල පසු අගය වාර්ෂික සමාලෝචනයට ලක්වන අතර කිසියම් වෙනස්කමක් සිදු වූවහොත් එම වෙනස්කමට අදාල පිරිවැය මත වූ ක්‍ෂය අගය අඩුකිරීමෙන් අනතුරුව එය ගෙනහැර දැක්වේ.එම ක්‍ෂය කල අගය අඩුකල නොහැකි අවස්ථාවලදී එම වත්කම මක වූ ක්‍ෂය ලියාහැර ඉන්පසු ඉතිරි වන අගය එම දේපල එසේත් නැත්නම් පිරියත උපකරණ පොත් අගය ලෙස ගෙනහැර දක්වනු ලැබේ.

ආයතනය සතු ඉඩම් සාධාරණ අගය අනුව ගෙනහැර දක්වනු ලබන අතර ඒ සඳහා වාර්ෂිකව සමුච්චික ක්‍ෂය අගයක් සටහන් කරනු නොලැබේ. ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කිරීමේදී එහි අගයේ වැඩිවීමක් සිදු වී නම් ආදායම් ප්‍රකාශයේ දක්වනු ලවන අතර එය හිමිකම් වෙන්ස්වීමේ ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන සංචිතහි දැක්වේ. අගය අඩුවීමද මෙයට ප්‍රථිවිරුද්ධ අයුරින් මෙලෙස සටහන් කරනු ලබයි.

# මූල්‍ය වාර්ථා සඳහා සටහන්

2.2.3 පසුව සිදුවූ පිරිවැය

දේපල,පිරියත හෝ උපකරණයන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරණ ලද පිරිවැය හේතුවෙන් එහි ඵලදායි ජීව කාලය වැඩි වන්නේ නම්,එහි අගය ගණනය කල හැකි නම් එවැන්නක් ගිණුම් ගත කරනු ලබන අතර එය ප්‍රාග්ධන වියදමක් ලෙස ගෙනහැර දැක්වේ. දේපල,පිරියත,උපකරණ දෛනික භාවිතයේදී සිදුවන වියදම් ගෙන දක්වනු ලබන්නේ ආයතනයේ ආදායම් ප්‍රකාශයෙහි වේ.

2.2.4 නොහඳුනාගැනීම

දේපල,පිරියත හෝ උපකරණයන්හි ධාරණ පිරිවැය හඳුනා ගන්නා අතර එම වත්කම සඳහා ආර්ථික වටිනාකමක් නොමැති අවස්ථාවන්හිදී හෝ භාවිතයෙන් ඉවත් කරඇති විටදී එය ආයතනය විසින් බැහැර කෙරේ. එහිදී ඇතිවන ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයෙහි දැක්වේ.

2.2.5 ක්ෂය

ආයතනයේ දේපල, පිරියත හෝ උපකරණ ක්ෂය කිරීමේදී එය ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලබන්නේ "සරල මාර්ග ක්‍රමය" යටතේ පිරිවැය හෝ ප්‍රත්‍යක්ෂිත වටිනාකමෙන් සුන්බුන් අගය අඩුකර ඵලදායි ජීවිත කාලය පුරාවට බෙදා හැරීමෙනි. ලීසිං පහසුකම් යටතේ ඇති වත්කම් ක්ෂය කරනු ලබන්නේ ලීසිං පහසුකම් සලසනු ලබන හෝ එම වත්කමේ ජීව කාලය යන අයිතම දෙකෙන් අඩු කාල සීමාවටයි. ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

ඵලාදයි ජීව කාලය වත්කම් වර්ගය අනුව

| | |
|---|---|
| ගොඩනැගිලි | 7.5 % |
| රථවාහන | 20 % |
| කාර්යාල උපකරණ | 10 % |
| පරිඝණක මෙවලම් | 33.33 % |
| මෙවලම් හා උපකරණ | 10 % |
| ගෘහ භාණ්ඩ/සවිකිරීම් | 10 % |

බදුකර වත්කම් මත වියදම් දැරීම බදු කාලය ඇතුලත

සෑම වසරකම ක්ෂය කරනු ලබන ක්‍රමය සහ අයිතමයන්ගේ ජීව කාලය සමාලෝචනය කර කළමණාකාරිත්වය විසින් මූල්‍ය වාර්ථාවල ගෙනහැර දක්වනු ලබයි.

2.2.6 ප්‍රාග්ධන නොනිමි වැඩ

වර්ෂය තුලදී කරනු ලැබූ ප්‍රාග්ධන වියදම් වර්ෂ අවසානයේදී නිමා නොවේ නම් ඒවා ඉහත සඳහන් ලෙස වර්ග කර ඇත. තවද වර්ෂය තුල වැඩ නිමා වූ ප්‍රාග්ධන අයිතම දේපල,පිරියත,උපකරණ ලෙස මූල්‍ය ප්‍රකාශන වල ගෙනහැර දක්වා ඇත.

2.2.7 මූල්‍යමය ව්‍යුත්පන්න වත්කම් වර්ගීකරණය

ආයතනය මූල්‍යමය වත්කම් මෙසේ ගෙනහැර දක්වනු ලබයි. සාධාරණ අගය මත ලැබිය යුතු දෑ ලෙස සහ විකිණීම සඳහා කල්පිරුණු පසුව යන අයුරින් මෙම ඉදිරිපත් කිරීම සිදුවේ. කළමණාකාරිත්වය එම වත්කම් ප්‍රථමයෙන් ඉහත ලෙස වර්ගීකරණය කරනු ලබන අතර ආයතනය තුල මෙම වර්ෂය තුලදී කිසිදු මූල්‍යමය වත්කමක් නොවීය.

2.2.8 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ මූල්‍යමය වත්කම් ලෙස දැක්වෙන අතර මෙම අයිතම වල වටිනාකම නිශ්චය කිරීමට වෙළඳපොල වටිනාකම් ගත නොහැක්කේ එය ක්‍රියාකාරී වෙළඳපොල තුල සංසරණය නොවන බැවිනි. මෙම වත්කම් ජංගම වත්කම් වන අතර මාස 12 ට වැඩි කාලයකින් පසු කල් පිරෙන්නේ නම් ජංගම නොවන වත්කම් ගණයට අයත් වේ. ආයතනයේ ණය සහ ලැබිය යුතු දෑ "වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ" ගෙන්ද සමන්විතයි. තවද මුදල් හා මුදල් වලට සමාන දෑ ද මෙහි පිළිඹිබු වේ.

2.2.9 මූල්‍ය මෙවලම් හිලව් කිරීම.

මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් හිලව් කොට මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගනු ලබන්නේ එහි ශුද්ධ වටිනාකම අනුව වන අතර මෙසේ සිදු කිරීමේ අරමුණ වන්නේ මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් අගයන් එකවිට හිලව් කිරීමයි.

2.2.10 මූල්‍ය වත්කම් හානිකරණය

ක්‍රමක්ෂය පිරිවැය මත වත්කම් ගිණුම්කරණ වර්ෂ අවසානයේදී ආයතනයේ මූල්‍ය වත්කම් හි අගයේ හානිකරණයක් වීද යන වග සමාලෝචනය කරනු ලබයි. මෙහිදී හානිකරණය වීමට යම්කිසි හේතුදාමයක් සිදුවිය යුතු අතර අවක්ෂේපිත සාධකද මේ සඳහා තිබිය හැකියි. මෙමගින් ආයතනයේ මූල්‍ය වත්කම් වලට හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ මුදල් ප්‍රවාහයන් හට බලපෑමක් සිදුවිය හැකි වේ. මෙයට හේතු ලෙස ණය ගැතියන්ට නැවත ගෙවීමේ නොහැකියාව,වස්තු භංගත්වය හෝ මූල්‍ය ප්‍රතිසංවිධාන කටයුතු දැක්විය හැකියි. තවද ආර්ථික වාතාවරණය මූල්‍ය ප්‍රවාහයන් අඩුවීම කෙරෙහි බලපෑ හැකි මූලික සාධකයක් වේ. ණය හා අනෙකුත් ලැබිය යුතු දෑ හි අලාභයන් මනිනු ලබන්නේ වත්කමේ දැන් පවත්නා අගය සහ අනාගත මුදල් ප්‍රවාහ වල අගය වට්ටම් කිරීමෙන් ලැබෙන අගය ගැනීමෙනි. වත්කම් අගය අඩු වන්නේ නම් එය ආදායම් ප්‍රකාශයේ ගෙන හැර දැක්වේ.

2.2.11 අපහායනය මූල්‍ය නොවන වත්කම්

කාල නිර්ණයන් නොමැති වත්කම් ක්‍රමක්ෂය සිදු කරනු නොලබයි. නමුත් වාර්ෂිකව අපහායනය සඳහා පරීක්ෂා කෙරේ. ඉහත සඳහන් වත්කම් හැර අනෙකුත් වත්කම් වාර්ෂිකව අපහායනය සඳහා පරීක්ෂා කරනු ලබයි. එහිදී වටිනාකමේ ඇතිවන වෙනස් වීම් මූල්‍ය ප්‍රකාශන වල දක්වනු ලබයි.

2.2.12 තොග

i තොග අගය කරන්නේ පිරිවැය හෝ උපලබ්දි අගය යන දෙකෙන් අඩු අගයටයි. ශුද්ධ උපලබ්දි අගය ගණනය කරන්නේ සාමාන්‍ය ව්‍යාපාරික තත්වයන් යටතේ තොගය විකිණිය හැකි අගයෙන් පිරිවැය හා විකුණුම් වියදම් අඩු කිරීමෙන් පසුවය

ii තොගයෙන් වටිනාකමෙන් විකුණුම් පිරිවැය ලෙස රු .3,282,781,217.00 මෙම වර්ෂයේ ආදායම් ප්‍රකාශයට ගෙන දක්වා ඇත.

iii සෙමින් අලෙවි වන තොග සහ යල් පනින ලද තොග සඳහා පොදු වෙන් කිරීමක් කළමණාකිරීත්වය විසින් තීරණය කර ඇත එය පහත සඳහන් ආකාරයට වේ.

| තොග වටිනාකම | ප්‍රතිශතය |
|---|---|
| පළමු හා දෙවන වසර ඇතුලත තොග අගයන් | 25% |
| දෙවන හා තුන්වෙනි වසර ඇතුලත තොග අගයන් | 50% |
| තුන්වෙනි හා හතරවන වසර ඇතුලත තොග අගයන් | 75% |
| වර්ෂ හතරට වඩා වැඩිනම් තොග අගයන් | 100% |

i. පහත සඳහන් මූල්‍ය ආයතනවලට තොග අගයන් ඇපකරණයන් වශයෙන් උකස් කර ඇත.

| මූල්‍ය ආයතනයේ නම | උගස් වටිනාකම |
|---|---|
| මහජන බැංකුව | 178,000,000.00 |
| සම්පත් බැංකුව | 147,000,000.00 |
| NDB බැංකුව | 160,000,000.00 |

2.2.13 වෙළඳ ලැබිය යුතු දෑ

මෙම ලැබිය යුතු දෑ ආයතනය විසින් මූල්‍යමය වත්කමක් ලෙස ශේෂ පත්‍රයේ දක්වනු ලබන අතර ගිවිසුම් ප්‍රකාර බැඳීමකදී මුදල් හැර වෙනත් වත්කම් මගින් එය ලබා ගැනීම සඳහා ආයතනයට අයිතියක් ඇත. තවද වසරකට වඩා වැඩි කාලයක් ගතවන විටදී වෙළඳ ලැබිය යුතු දෑ ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශ වලට ඇතුලත් කර ඇත. තවද බොල් ණය අදාල වර්ෂය තුල ආදායම් ප්‍රකාශයේ සටහන් කෙරේ. තවද අඩමාණ ණය සඳහා වෙන් කිරීමක්ද මූල්‍ය ප්‍රකාශන වල කරනු ලබන්නේ නිශ්චිත සාධක යම් අයුරකින් ඇත්නම් පමණි. මේ සඳහා ආයතනය විසින් ප්‍රමාණාත්මක වෙන් කිරීමක් සිදු කර ඇත .

2.2.14

ආයෝජන

අ) දීර්ඝ කාලීන ආයෝජන

දිගු කාලීන ආයෝජන ජංගම නොවන ආයෝජන ලෙස වර්ග කර ඇති අතර ඒවායේ අගය පිරිවැය වෙයි.ආයෝජන අත්පත් කර ගැනීමේ පිරිවැය ( මිලදී ගැණුම් පිරිවැය, තැරැව් ගාස්තු , හුවමාරු ගාස්තු ) ද ඇතුලත්ව මුළු පිරිවැය ගණනය කරනු ලැබේ.

ආ ) කෙටි කාලීන ආයෝජන

කෙටි කාලීන ආයෝජන ශේෂ පත්‍ර දිනට පැවති වෙළඳ අගයට හදුනාගනු ලබයි. කෙටි කාලීන ආයෝජන හි ලාභ අලාභ ආදායම් ප්‍රකාශයට ගනු ලැබේ.

2.2.15 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ වලින් ගම්‍ය වන්නේ අතැති මුදල්,ඉල්ලුම් තැන්පතු,ඉහල ද්‍රවශීලතා-වයකින් යුතු ආයෝජන වේ. මෙහිදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී යොදා ගනු ලබන්නේ බැංකු අයිරාව හැර අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතු පමණි.

2.2.16 ප්‍රකාශිත ප්‍රාග්ධනය

ආයතනයේ සියළුම කොටස් වල එකතුව එහි නාමික අගයෙන් වැඩි කිරීමෙන් ප්‍රකාශිත ප්‍රාග්ධනය ගණනය කොට ඇත.

මෙම ප්‍රකාශිත ප්‍රාග්ධනය පිළිබඳ හිමිකම,වගකීම දරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකා රජයේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය මගින් වේ.

2.2.17 වෙළඳ ගෙවිය යුතු දෑ

සමාගම වෙළඳ ගෙවිය යුතු දෑ මූල්‍ය වගකීමක් සේ සලකනු ලබන අතර එය ශේෂ පත්‍රයේ ගෙවිය යුතු දෑ යටතේ සටහන් කරයි. මෙය සැපයුම්කරුවන් හා ඇති වූ ගණුදෙනු වල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන්නා වූ මූල්‍ය වගකීමයි. සැපයුම්කරුවන්ගෙන් ලබාගත් භාණ්ඩ හා සේවා වෙනුවෙන් මුදල් හෝ තවත් එවැනි වත්කම් වලින් ආයතනය ගෙවිය යුතුයි. වර්ෂයකට අඩු කාලයකදී ගෙවිය යුතු නම් ඒවා ජංගම වගකීම් වන අතර වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වේ නම් ඒවා ජංගම නොවන වගකීම් ගණයට අයත් වේ. වෙළඳ ණය හිමියෝ සාධාරණ අගය මත හදුනාගෙන ඇත.

2.2.18 ණය

ආයතනය ගණු ලබන ණය ප්‍රතිපාදන ප්‍රථමයෙ-න් සාධාරණ අගය මත හදුනා ගනු ලබයි. පසුව මෙය ක්‍රමක්ෂය පිරිවැය මත හදුනා ගැනේ. තවද වාර්ෂිකව සිදුකරනු ලබන ගෙවීම් ආදායම් ප්‍රකාශයේ සටහන් වන අතර එහි වගකීම වසරකට වැඩි නම් ජංගම නොවන වගකීම් ලෙසත් වසරකට අඩු නම් ජංගම වගකීමක් ලෙසත් ශේෂ පත්‍රයේ දැක්වේ.

2.2.19 කල්බදු ගිණුම්කරණය

ආයතනය දේපල,පිරියත,උපකරණ කල්බදු පදනම මත ලබාගෙන ඇත්නම් සැලකිය යුතු අවදානමක් ඇති අතර එම නිසා ඒවා මූල්‍ය කල්බදු ලෙස හදුනා ගනු ලබයි. මූල්‍ය කල්බදු ප්‍රාග්ධනිත කිරීමේදී සාධාරණ අගය හෝ කල්බදු ගෙවීම් වල අවම අගය යන අයිතමයන්ගේ අඩු අගය ගනු ලැබේ.

සියළුම කල් බදු වාරික,වගකීම් සහ මූල්‍ය පිරිවැය ලෙස බෙදා හැර දැක්වේ. මෙහිදී වසරක් තුල කල් පිරෙන කල් බදු වාරික ජංගම වගකීම් ලෙසද අනෙකුත් වාරික ජංගම නොවන වගකීම් ලෙසද බෙදා දැක්වේ.

වාරික පොලිය ආදායම් ප්‍රකාශයට ගනු ලබන අතර එම වත්කම් ක්ෂය කරනු ලබන්නේ කල්බදු වාරික වර්ෂ හෝ ජීව කාලය යන අයිතම දෙකෙන් අඩු අගයට වේ.

2.2.20 ආදායම් බදු

අ) වර්තමාන බදු

වර්තමාන ආදායම් බදු ගණනය කර වෙන් කොට ඇත්තේ ව්‍යාපාරයේ මෙහෙයුම් අනුව 2006 අංක 10 දරණ ආදායම් බදු පනතේ නියමයන්ට අනුකූලවයි.

ආ) විලම්භිත බදු

විලම්භිත බදු තීරණය කරනු ලැබුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා සැලකිල්ලට ගනු ලබන වත්කම් හා බැරකම් වල ප්‍රමාණය බදු වාර්ථාකරණය සඳහා සැලකිල්ලට ගනු ලබන ප්‍රමාණය අතර තාවකාලිකව වෙනස මත ගණනය කිරීමෙනි. විලම්භිත බදු ගණනයේදී බදු ගාස්තු හා එයට අදාල නීති භාවිතයට ගෙන ඇත.

විලම්භිත බදු වත්කම් මත හදුනාගනු ලබන අතර එය ඉදිරි ගිණුම් වර්ෂ වලදී ඇතිවිය හැකි ආයතනයේ ලාභය සමඟ හිලව් කොට දැක්වීම සඳහා භාවිතා කරනු ලැබේ.

විලම්භිත බදු බදු වත්කම් සහ වගකීම් හිලව් කිරීමේදී නීත්‍යානුකූල බලාත්මක වන අයුරින් බදු වත්කම් බදු වගකීම් සමඟ හිලව් කෙරේ.

පමාකරන ලද බදු වත්කම සෑදී ඇත්තේ ආයතනයේ ඉදිරියට ගෙනෙන ලද බදු අලාභය හේතුවෙනි. මෙය රු.260,323,649.00 කි. මෙය ආයතනයේ ගිණුම් ප්‍රකාශ වලට ගෙන නැත්තේ එය අයකරවා ගැනීමට සාමාන්‍ය බදු කාලසීමා-වට වඩා කාලයක් ගතවන බැවිනි. මෙය සටහන් වල දක්වා ඇත.

ඇ) පිරිවැටුම මත පදනම් වූ බදු

පිරිවැටුම මත පදනම් වූ බදු වලට එකතු කල අගය මත බදු සහ ජාතිය ගොඩනැංවීමේ බදු ඇතුලත් වේ.

2.2.21 සේවක ප්‍රතිලාභ මත වූ පිරිවැය

අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම ලෙස හදුන්වනු ලබන්නේ වෘත්තීය සේවා කාලය නිමවීමෙන් පසු ක්‍රියාත්මක වන නිශ්චිත දායකත්ව සැලසුම හැර අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලැස්මකි. ශේෂ පත්‍රයේ ආයතනික වගකීම නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම මගින් ගණනය කොට ඇත්තේ 1983 අංක 12 දරණ පාරිතෝ-ෂිත දීමනා ගෙවීම පිළිබඳ පනතට අනුව වේ. සේවකයෙකු වෙත විශ්‍රාම දීමනා ගෙවීමේ වගකීම පැන නගිනුයේ වසර 5 ක පූර්ණ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුවයි. මෙම වගකීම ගිණුම් ප්‍රකාශන වල හදුනාගෙන ඇත. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමේ හිඟය හෝ අතිරික්තය වර්ෂය සඳහා ගණනය කරනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 ට ප්‍රකාරවයි .

ආ) සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

සියළුම සේවක,සේවිකාවන් අර්ථ සාධක අරමුදල යටතේ සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල යටතේ ලියාපදිංචි කොට ඇති අතර අදාළ වර්ෂයේදී එම සේවක සේවිකාවන් සඳහා ගෙවිය යුතු දායක මුදල රෙගුලාසි වලට අනුව සම්පාදනය කොට ඇත .

සියළුම සේවකයින් සඳහා වූ අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට සම්බන්ධ දායකත්වය වියදම් සිදු වූ ආකාරයට ලාභ අලාභ සැකසීමේදී හදුනාගත හැක .

2.2.22 ආදායම් හදුනාගැනීම

අ) භාණ්ඩ විකුණුම් ආදායම

භාණ්ඩයක් විකුණුම් ලෙස හදුනාගනු ලබන්නේ පාරිභෝගිකයා වෙත භාණ්ඩයේ අවදානම සහ අයිතිය හුවමාරු වන අවස්ථාවේදීයි

ආ) සේවා සැපයුම් ආදායම

සේවා විකුණුම් වලින් ලත් ආදායම හදුනාග ගනු ලබන්නේ සේවාවේ ප්‍රතිලාභ හුවමාරු වූ අවස්ථාවේදී වන අතර එම ආදායම අදාල ගිණුම් වර්ෂයේදී හදුනාගැනේ .

ඇ) පොළී ආදායම

පොළී ආදායම හදුනාගනු ලබන්නේ උපචිත පදනම මත වේ.

ඈ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් ද උපචිත පදනම මත හදුනාග නු ලබයි.

ඉ) දේපල,පිරියත,උපකරණ බැහැර කිරීමේ ලාභ

දේපල,පිරියත,උපකරණ බැහැර කිරීමේ ලාභ/අලාභ හදුනාගනු ලබන්නේ එය බැහැර කල වර්ෂය තුලයි.

# මූල්‍ය වාර්ථා සඳහා සටහන්

2.2.23 වියදම් හදුනා ගැනීම

අ) අයහාර වියදම්

සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයේදී වියදම් හදුනාගනු ලබන්නේ ආදායම් ඉපැයීම සඳහා දැරූ පිරිවැය සහ එය මත සෘජු සම්බන්ධතාවය පදනම් කරගැනීමෙනි.

එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා දරනු ලබන පිරිවැය,ප්‍රාග්ධන නඩත්තු වියදම් ආදිය මෙහෙය වීමේ වියදම්,ආයතනික වියදම් ආදී කටයුතුවල ඵලදායිතාවය ඉහල නංවමින් ආදායම් ඉපැයීම සඳහා සිදුකල වියදම් අයහාර වියදම් ලෙස දැක් වේ. වර්ෂ අවසානයේ මෙහි ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට ගනු ලබයි.

ආ) ප්‍රාග්ධන වියදම්

ප්‍රාග්ධන වියදම් දරණු ලබන්නේ වත්කමේ ස්වභාවය වැඩි දියුණු කිරීමටයි එනම් ඵලදායිතාවය වැඩි කිරීම සඳහා දරණ වියදම් වේ. එසේම ව්‍යාපාරය ඉදිරියට පවත්වාගෙන යාමට හෝ එහි පරිමාණය වර්ධනය කිරීමට සහ ව්‍යාපාරයේ පැවැත්ම සඳහා ප්‍රාග්ධන වියදම් දරනු ලැබේ.

ඇ) ණය ගැනුම්

ආයතනය ප්‍රධාන ලෙස ණය මුදල් යොදා ඇත්තේ ආයතනයේ ප්‍රාග්ධන වත්කම් වැඩි කරගැනීමට,ප්‍රතිග්‍රහනය සඳහා සහ ඉදි කිරීම් කටයුතු සිදු කිරීමටය. මෙහිදී ප්‍රාග්ධන වත්කම් වෙනුවෙන් යොදා ඇති වටිනාකම /තක්සේරු අගය අදාල වත්කම් කාණ්ඩය යටතේ දක්වා ඇති අතර අනෙකුත් සියළුම ණය ගැණුම් ආදායම් ප්‍රකාශයේ ගලපා දක්වා ඇත. ණය ගැණුම් යටතේ පොළී සහ ණය සම්බන්ධ අනෙකුත් වියදම් ද දක්වා ඇත.

ඈ) ශුද්ධ මූල්‍යමය ආදායම්/ වියදම්

මූල්‍යමය ආදායම් ලෙස බැංකු තැන්පතු ආයෝජන සඳහා පොළිය,සේවක ණය නැවත ගෙවීම් සහ මූල්‍යමය වත්කම් වල සාධාරණ අගය වෙනස්වීම් ආදායම් ප්‍රකාශයන්හි සටහන් කරනු ලැබේ.පොළී ආදායම් සංචිත පදනම මත සාධනිය පොළි ක්‍රමය මත හදුනා ගෙන ඇත .

මූල්‍යමය වියදම් ලෙස පොළි වියදම්/ගෙවීම් ,මූල්‍යමය වත්කම් සාධාරණ අගය වෙනස් වීම්,(අපහයන අලාභ) සහ ආයතනයේ ප්‍රාග්ධන වත්කම් කෙරෙහි ඉදිකිරීම් ප්‍රතිග්‍රහනයට අයත් නොවන වත්කම් ආදායම් ප්‍රකාශයෙහි සාධනීය පොළී ක්‍රමය යටතේ හදූනාගෙන ඇත

ඉ) බොල් ණය සඳහා වෙන් කිරීම්

මෙම වෙන් කිරීම හදුනාගනු ලබන්නේ වර්ථමාන නීතිමය වගකීමක් හෝ අතීතයේ ඇතිවූ සමහර ගනුදෙනු පදනම් කර ගනිමිනි. මෙම ගණුදෙනු නිරවුල් කිරීමේදී මුදල් ප්‍රවාහ ආයතනයෙන් පිටතට ගලායන අතර මේ සඳහා යොදා ගන්නා වූ උපක්‍රමයක් ලෙස ඇස්තමේන්තුවක් ඇතිකිරීම සාමාන්‍යයෙන් සිදු කරයි. තනි තනි ශේෂ සියුම් ලෙස පරීක්ෂා කර බොල්ණය වියදම් හදුනාගත යුතුය. එසේ හදුනාගන්නා පිරිවැය ආවරණය කර ගැනීම

උදෙසා ආයතනය විසින් ප්‍රමාණාත්මක ඇස්තමේන්තුවක් ඇති කර ගත යුතුයි. ඒ සඳහා ආයතනයේ කළමණාකාරීත්වය පහත සඳහන් ඇස්තමේන්තු භාවිතා කරයි.

වසර දෙකකට වඩා අඩු නම් ණයගැති වටිනකමින් 25% ක වෙන් කිරීමක්ද වසර දෙකකට වඩා වැඩිනම් වටිනාකමින් 100% ක වෙන් කිරීමක්ද සිදු කරනු ලබයි.

2.2.24 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

ආයතනයේ හෝ වෙනත් පරිබාහිර තුන්වන පාර්ශවයක් විසින් කරන්නා වූ ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ආයතනයේ මූල්‍ය ප්‍රතිපත්ති හා තීරණ වලට සැලකිය යුතු අන්දමේ බලපෑමක් කල හැකි නම් හා එසේ සිදු වී ඇති නම් ඒ පිළිබද මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කල යුතුය. අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 23 මගින් හෙලිදරව් කරනු ලබයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 23 දැක්වෙන අයුරින් සම්බන්ධිත පාර්ශව යනුවෙන් හැදින්වෙන්නේ ආයතනයේ ප්‍රධාන කළමණාකාරීත්වය වන අතර මෙම පාර්ශවය තම බලතල සහ වගකීම් අනුව ආයතනයේ සැලසුම්කරණය,අධීක්ෂණය සහ පරිපාලනය කරනු ලබයි. තවද අධ්‍යක්ෂක මණ්ඩලය (විධායක නිළධාරීන් අධක්ෂකවරුන් සහ විධායක නොවන අධක්ෂකවරුන් ) සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය වේ.මෙම පාර්ශව ආයතනයේ ප්‍රධාන කළමණාකාරීත්ව සේවා මණ්ඩලය ලෙස ද හැදින්වේ.

ආස්ථිත්වයේ සම්බන්ධිත පාර්ශව

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරී සම්බන්ධිත ඒකකයන් කිසිවක් නොමැත.

2.2.25 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මෙම ආයතනයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය“වක්‍ර ක්‍රමය අනුව” සකස් කර ඇත.

2.2.26 අංශ තොරතුරු

ආයතනය නියැලී සිටින ව්‍යාපාරික ක්‍රියාකාරකම් සහ එහි ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුලින් උපයන ආදායම, දරන ලද වියදම මෙහෙයුම් අංශ තුල ඇතුලත් වේ. ආයතනයේ අනෙකුත් අංශ වලින් සිදුවන ගණුදෙනු සමඟ මෙහෙයුම් අංශ ආදායම සහ වියදම හදුනාගනු ලබයි. අංශ වල සම්පත් බෙදා හැරීම සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ කාර්යසාධන තක්සේරු කිරීම සඳහා සියළුම මෙහෙයුම් අංශ වල මෙහෙයුම් ප්‍රතිඵල ක්‍රමවත් ලෙස ආයතනයේ කළමණාකාරීත්වය විසින් සමාලෝචනයට ලක් කරනු ලබයි.

මේ සඳහා වෙන් වෙන්ව පවතින මූල්‍ය තොරතුරු ලබාගත හැකිය. මේ තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුල සටහනක් මගින් හෙලිදරව් කරඇත.

2.2.27 කොටසක ඉපැයුම

සාමාන්‍ය කොටසක් වෙනුවෙන් හිමි ලාභාංශ ආයතනයේ වර්ෂය තුල ඇති බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් බෙදූ කල කොටසක ඉපැයුම ලැබේ.

2.2.28 ශේෂ පත්‍ර දිනට පසු සිදු වීම්

ගිණුම් කාල පරිච්චේදයේ අවසන් දිනයත් මූල්‍ය ප්‍රකාශන අධිකාරී බලයෙන් යුතුව නිකුත් කරන දිනයන් අතර කාලසීමාවේදී මූල්‍ය ප්‍රකාශන වලට බලපෑ හැකි සතුටුදායක හෝ අසතුටුදායක සිද්ධි ඇති විය හැකිය. මේවා ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් ලෙස හැදින්වේ.

මෙම සිද්ධි සලකා බලා මූල්‍ය ප්‍රකාශනවල යම් සංශෝධනයන් අවශ්‍ය නම් ඒ සඳහා ප්‍රමාණාත්මක හෙලිදරව් කිරීමක් හෝ ගැලපීමක් අවශ්‍ය නම් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කල යුතුය. එලෙස සිදුවීම් හට ගෙන නොමැති නම් ඒ අවස්ථාවලදී ගැලපිමෙන් අවශ්‍ය නොවේ. තවද අදාල කාලය තුල ආයතනයේ ගැලපිය යුතු හෝ සටහන් විය යුතු මූල්‍ය ප්‍රකාශන වලට බලපෑ කිසිදු හේතුවක් නොවීය.

2.2.29 වගකීම් සහ අවිනිශ්චිත සිදුවීම්

වාර්ථාකරණ දිනට පැවති වගකීම් සහ අවිනිශ්චිත සිදුවීම් මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 24 මගින් හෙළිදරව් කරයි.

2.2.30 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

ශ්‍රී ලංකා මූල්‍ය වාර්ථාකරණ ප්‍රමිතීන් වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ ලෙස සකස් කිරීම හා ඉදිරිපත් කිරිම සඳහා වූ වගකීම ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය සතුය.

මූල්‍ය ප්‍රකාශන වල හෝ ආයතනයේ වංචා හා වැරදි ඇත්නම් ඒවා සොයාගෙන ඒවාට පිළියම් යෙදීම, අවශ්‍ය අවස්ථාවලදී නව ගිණුම්කරන ප්‍රතිපත්ති හා ප්‍රමාණාත්මක ඇස්තමේන්තු ඇති කිරීම, තෝරා ගැනීම, භාවිතය සහ සමාලෝචනය කර අවශ්‍ය විටක සංශෝධනය කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතුය.

# මූල්‍ය වාර්තා සඳහා සටහන් 2014 /2015

| සටහන 03-ආදායම | 2014/2015 | 2013/2014 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| දළ විකුණුම් | 3,865,380,141 | 3,056,148,037 |
| අඩු :ආපසු එවුම් | (3,440,386) | (4,139,177) |
| ශුද්ධ විකුණුම් ( සටහන 03.01) | 3,861,939,755 | 3,052,008,860 |

| සටහන 03.01 (ශුද්ධ විකුණුම් ) | 2014/2015 | 2013/2014 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| රසායන ද්‍රව්‍ය හා ආශ්‍රිත ද්‍රව්‍ය | 708,516,471 | 693,769,311 |
| අයි.සී.ටී නිෂ්පාදන | 615,724,919 | 467,681,377 |
| කාර්යාල සැපයුම්කරුවන් | 419,423,462 | 357,650,887 |
| රථ වාහන ටයර් අංශය | 214,639,899 | 189,269,651 |
| තීරුබදු | 307,089,572 | 229,800,783 |
| විදුලි හා ඉලෙක්ට්‍රෝනික උපකරණ | 304,034,685 | 204,572,856 |
| විශේෂ ව්‍යාපෘති ඒකකය | 266,433,079 | 205,493,861 |
| ගෘහස්ථ උපකරණ මෙවලම් | 300,182,510 | 235,468,034 |
| ඉදිකිරීම් හා ලෝහ භාණ්ඩ | 493,743,644 | 341,289,804 |
| වෙනත් | 232,151,514 | 127,012,296 |
| | 3,861,939,755 | 3,052,008,860 |

| සටහන 03.02 - අදියර ගත මෙහෙයුම් ප්‍රතිඵල (දළ ලාභය) | 2014/2015 | 2013/2014 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| රසායන ද්‍රව්‍ය හා ආශ්‍රිත ද්‍රව්‍ය | 194,216,811 | 181,134,920 |
| අයි.සී.ටී නිෂ්පාදන | 64,142,278 | 43,509,804 |
| කාර්යාල සැපයුම්කරුවන් | 51,598,398 | 40,446,115 |
| රථ වාහන ටයර් අංශය | 17,998,558 | 16,264,760 |
| තීරු බදු | 93,857,291 | 71,565,585 |
| විදුලි හා ඉලෙක්ට්‍රෝනික උපකරණ | 45,681,509 | 47,279,810 |
| විශේෂ ව්‍යාපෘති ඒකකය | 19,514,125 | 14,133,963 |
| ගෘහස්ථ උපකරණ මෙවලම් | 44,918,894 | 30,477,406 |
| ඉදිකිරීම් හා ලෝහ භාණ්ඩ | 49,811,691 | 36,022,150 |
| වෙනත් | 37,418,983 | 19,296,796 |
| | 619,158,538 | 500,131,309 |

# මූල්‍ය වාර්ථා සඳහා සටහන් 2014 /2015

| සටහන 04-අනෙකුත් මෙහෙයුම් ආදායම් | 2014/2015 රු. ශත | 2013/2014 රු. ශත |
|---|---|---|
| කොමිස් - ඩේවිඩ් පීරිස් මොටර් කොම්පැනි(බජාජ්) | - | 1,276,850.00 |
| විකුණුම් කොමිස් | - | 1,408,570 |
| විනිමය අනුපාත ලාභ/අලාභ | 165,354 | 286,493 |
| කොමිස් - සී .අයි .සී බීජ | 175,449 | 323,894 |
| පාසැල් නිල ඇඳුම් ව්‍යාපෘතියෙන් ලද ආදායම |  | 186,835 |
| වෙනත් විවිධ ආදායම් (සටහන 04.01) | 131,181 | 217,549 |
| කොමිස්-ඩබල් A | - | 1,336,256 |
| පොලිස් මූලස්ථානය | 2,325,133 | 895,730 |
| යුනිමෝ එන්ටර්ප්‍රයිසස් (කොමිස්-ටයර්) | - | 952,830 |
| පහසු ගෙවීමේ ණය යෝජනා ක්‍රමයේ පොළී ආදායම | 752,459 | - |
| සැපයුම් කරුවන් ලියාපදිංචිවීමේ ආදායම | 24,000 | - |
| පහසු ගෙවීමේ ණය යෝජනා ක්‍රමයේ ආදායම | 462.498 | - |
| ආමි කැන්වස් සපත්තු සැපයුම් ආදායම | 750,646 | 1,112,320 |
| අවිනිශ්චිත ණය ගැති අධි වෙන්කිරීම | - | 1,713,472 |
| යුනිලීවර් ආයතනයේ වට්ටම් ලැබීම් | - | 4,616,433 |
|  | 4,786,720 | 14,327,232 |

| (සටහන 04.01) - අනෙකුත් ආදායම් | 2014/2015 රු. ශත | 2013/2014 රු. ශත |
|---|---|---|
| හානිවු තොග විකුණුම් | 101,707 | 176,572 |
| හැරවුම් චෙක් පොළි | 13,924 | 1,010 |
| සැපයුම් කරුවන්ගේ මිලෙහි වෙනස | - | 19,087 |
| වෙනත් | 834 | 20,880 |
| VISTA ADVERTISING – HP කොමිස් | 14,716 | - |
|  | 131,181 | 217,549 |

| සටහන 05-බෙදා හැරීමේ වියදම් | 2014/2015<br>රු. ශත | 2013/2014<br>රු. ශත |
|---|---|---|
| විකිණුම් දිරි දීමනා | 19,145,354 | 19,871,166 |
| වෙළඳ සාම්පල් පරීක්ෂාව සාම්පල් වියදම් | 1,392,063 | 1,755,382 |
| ටෙන්ඩර් පත්‍රිකා | 594,732 | 543,527 |
| සැපයුම්කරුවන් ලියාපදංචි කිරීමේ වියදම් | 2,349,346 | 1,542,556 |
| ගබඩා සහ ප්‍රදර්ශණාගාර කුළී | 52,807,796 | 27,665,980 |
| විකිණුම් මධ්‍යස්ථාන වියදම් | 540,600 | - |
| ලොරි කුළී/ ප්‍රවාහනය | 5,535,059 | 2,888,191 |
| සේවා ගාස්තු | 8,177,994 | 12,326,440 |
| පංචිකාවත්ත ප්‍රදර්ශනාගාරය ඉවත්කිරීමේ පාඩුව | 2,875,358 | - |
| ප්‍රතිපූර්ණ විකුණුම් වියදම් | 11,101,545 | 11,650,310 |
| ප්‍රතිපූර්ණ ණය එකතු කිරීමේ වියදම් | 1,031,844 | - |
| වෙළඳ සල් පිල් වියදම් | - | 1,199,383 |
| බලපත්‍ර ගාස්තු-විකිණුම් | 441,580 | 343,130 |
| ටෙලෙක්ස්,ෆැක්ස් හා ඊ මේල් ගාස්තු | 20,000 | 3,353 |
| විදේශ ගමන් ගාස්තු | 2,620,072 | 5,922,685 |
| වෙළඳ ප්‍රවර්ධන වියදම් | 20,136,557 | 11,526,070 |
| ප්‍රචාරණය | 5,743,479 | 9,922,884 |
| තෑගි වවුචර් | (14,668) | 27,657 |
| වියදම් සහ පැටවීමේ වියදම් | 2,661,057 | 152,388 |
| ණය ගැති හානිකරණය /අඩු කිරීම් | 63,276 | - |
| අයකල නොහැකි එකතු කල අගය මත බදු | 11,587,172 | 10,120,058 |
| ජාතිය ගොඩ නැංවීමේ බද්ද | 33,148,087 | 26,485,869 |
| සහයෝගී පාරිභෝගිකයින්ට විකිණුම් ප්‍රවර්ධනය | 1,720,616 | 203,378 |
| වෙළඳ නියෝජිත කොමිස් | - | 100,800 |
| | 183,678,919 | 144,242,207 |

# මූල්‍ය වාර්තා සඳහා සටහන් 2014 /2015

## සටහන 06 පරිපාලන වියදම්

| | 2014/2015 රු. ශත | 2013/2014 රු. ශත |
|---|---|---|
| වැටුප් | 50,489,795 | 45,707,660 |
| සේ.අ.දායක මුදල් | 17,843,307 | 15,020,623 |
| සේ.නි.භා.අ. දායක මුදල් | 3,568,663 | 3,010,265 |
| අතිකාල හා විශේෂ දීමනා | 22,224,163 | 21,278,524 |
| වාර්ෂික ප්‍රසාද දීමනා | 11,525,060 | 8,975,870 |
| කොන්ත්‍රාත් අනියම් සේවක වැටුප් | 73,991,412 | 55,590,114 |
| සේවක ප්‍රතිලාභ පිරිවැය | 453,493 | 442,011 |
| කාර්ය මණ්ඩල සුභසාධක පහසුකම් | 4,806,657 | 4,356,214 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් | 1,667,029 | 1,786,835 |
| කාර්ය මණ්ඩල වාහන සහ ඉන්දන දීමනා | 17,311,279 | 7,346,666 |
| පවුල් සුභසාධන දීමනා | 2,170,000 | 2,037,000 |
| නිල ඇඳුම් | 951,080 | 370,332 |
| ශ්‍රම වියදම් | 14,165,765 | 7,630,241 |
| නිවාඩු දින දීමනා | 3,734,421 | 3,122,468 |
| පාරිතෝෂික වෙන් කිරීම් | 3,358,401 | 2,488,333 |
| ගමන් හා යැපීම් ගාස්තු | 3,571,314 | 2,280,419 |
| විගණන ගාස්තු | 148,900 | 148,900 |
| උපදේශක ගාස්තු | 45,000 | 205,622 |
| නීති ගාස්තු | 1,281,319 | 560,442 |
| ලේඛක වියදම් | 84,870 | 84,901 |
| අධ්‍යක්ෂක වැටුප් | 1,152,000 | 1,260,000 |
| අධ්‍යක්ෂක දීමනා | 178,200 | 99,000 |
| අධ්‍යක්ෂක මණ්ඩල රැසස්වීම් වියදම් | 27,270 | 36,450 |
| රක්ෂණ වියදම් | 1,732,095 | 960,901 |
| ගාස්තු සහ බදු | 2,495,182 | 2,057,097 |
| බලපත්‍ර ගාස්තු | 789,563 | 129,494 |
| දුරකථන වියදම් | 14,756,711 | 9,223,594 |
| විදුලි ගාස්තු | 13,494,341 | 10,709,843 |
| තැපැල් ගාස්තු | 1,200,236 | 997,642 |
| ජල බිල්පත් | 1,720,857 | 1,386,862 |
| ප්‍රවෘත්ති පත්‍ර හා සඟරා | 233,017 | 110,551 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 21,573,579 | 6,941,743 |
| නඩත්තු-ගොඩනැගිලි | 147,519 | 798,225 |
| නඩත්තු- කාර්යාල උපකරණ | 12,150,316 | 9,408,688 |
| නඩත්තු- ගබඩා උපකරණ | 711,885 | 756,084 |
| නඩත්තු-ප්‍රදර්ශනාගාර | 2,785,989 | 2,483,368 |
| නඩත්තු-රථ වාහන | 2,746,514 | 2,461,150 |
| මෝටර් රථ වාහන ලියාපදිංචිය හා රක්ෂණය | 98,961 | 944,759 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 7,233,152 | 5,827,499 |
| පරිගණක කළමණාකරණ ගාස්තු | 305,178 | 826,490 |
| පරිගණක නඩත්තු | 3,742,830 | 1,073,731 |
| ක්ෂය කිරීම්-ගොඩනැගිලි | 3,839,219 | 3,839,219 |
| ක්ෂය කිරීම්- මෝටර් රථ | 9,663,098 | 13,733,997 |
| ක්ෂය කිරීම්-යන්ත්‍රෝපකරණ | 13,509,788 | 8,431,027 |
| ක්ෂය කිරීම්-ලී භාණ්ඩ | 4,703,390 | 3,178,298 |
| ක්ෂය කිරීම්-මෙවලම් හා උපකරණ | 93,144 | 63,207 |
| විලම්භිත ණය පිරිවැය | 11,196,324 | 178,366 |
| රථවාහන කුළී | 8,496,790 | 2,123,244 |
| බැංකු ගාස්තු | 11,927,959 | 8,990,675 |
| කාර්ය මණ්ඩල පුහුණු හා සංවර්ධන වියදම් | 587,395 | 822,888 |
| අඩි අය කිරීම් | 17,159 | 88,422 |
| ගාල් කිරීම් වියදම් | 1,959,168 | 1,966,768 |
| | 388,659,957 | 284,352,722 |

## සටහන 07-ශුද්ධ මුල්‍ය ආදායම්/ (වියදම්)

| | 2014/2015 රු. ශත | 2013/2014 රු. ශත |
|---|---|---|
| පොළී ආදායම් | | |
| කෙටි කාලීන තැන්පතු සඳහා පොළී ආදායම | 25,975,876 | 37,669,135 |
| NDB බැංකුව පොළී ආදායම | 75,049 | 35,939 |
| සේවක ණය මත පොළී | 847,259 | 681,741 |
| සේවක මණ්ඩල පෙර ගෙවුම් ප්‍රතිලාභ | 453,493 | 442,011 |
| | 27,351,677 | 38,828,826 |
| පොළී වියදම් | | |
| බැංකු අයිරා පොළී | 22,787,440 | 10,685,108 |
| කෙටි කාලීන. ණය පොළී | 34,341,966 | 31,612,700 |
| කල් බදු පොළී | 5,092,728 | 3,653,164 |
| | 62,222,134 | 45,950,972 |
| | (34,870,457) | (7,122,146) |

## සටහන 08-ආදායම් බදු වියදම්

| | සටහන් | 2014/2015 රු. ශත | 2013/2014 රු. ශත |
|---|---|---|---|
| වර්ෂය මත ලාභය සඳහා ආදායම් බදු -2014/2015 | 08.01 | 6,686,063 | 16,671,606 |
| වර්ෂය මත ලාභය සඳහා ආදායම් බදු -2009/2010 | | - | 8,547,768 |
| ලාභාංශ බදු ගැලපීම් | | 1,188,681 | 2,702,523 |
| විලම්භිත බදු | 08.02 | (6,583,024) | 131,891 |
| | | 1,291,720 | 28,053,788 |

## සටහන 8.1 ගිණුම්කරණ ලාභය හා බදුකරණ ලාභය සංශෝධන සටහන මාර්තු 31 වර්ෂ අවසානය

| | 2014/2015 රු. ශත | 2013/2014 රු. ශත |
|---|---|---|
| ගිණුම්කරණ ලාභය බදු පෙර | 16,735,925 | 78,741,461 |
| වෙනත් මූලාශ්‍රයන්ගෙන් ලත් ආදායම් | (26,898,184) | (38,386,815) |
| මුළු හිලව් කර නොහැකි ප්‍රමාණය | 53,697,148 | 42,962,632 |
| මුළු හිලව් කර හැකි ප්‍රමාණය | (33,696,464) | (30,101,861) |
| ගැලපූ ව්‍යාපාරික ලාභය | 9,838,425 | 53,215,416 |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | 36,736,609 | 91,602,231 |
| ඉදිරියට ගෙන එන ලද උපයෝගිතා බදු අලාභය | | |
| වර්ෂය සඳහා බදු අයකල හැකි ආදායම් | (12,857,813) | (32,060,781) |
| වර්ෂය සඳහා බදු අයකල හැකි ආදායම | 23,878,796 | 59,541,451 |
| | 6,686,063 | 16,671,606 |

# මූල්‍ය වාර්තා සඳහා සටහන් 2014 /2015

| ඉදිරි වර්ෂය සඳහා ගෙන යන ලද උපයෝගිතා බදු අලාභය රු. ශත 247,465,836/= (2013/2014 - රු.ශත 260,323,649/-) | 2014/2015 රු. ශත | 2013/2014 රු. ශත |
|---|---|---|
| **සටහන 8.2 විලම්භිත බදු වියදම්/(ප්‍රතිවර්තන)** | | |
| **විලම්භිත බදු වියදම් /(ප්‍රතිවර්තන) පැන නැගීම** | | |
| බදු සඳහා ත්වරිත ක්ෂය | (3,922,796) | 1,337,933 |
| බොල් හා අඩමාන ණය වෙන් කිරීම් | - | 497,772 |
| සේවක ප්‍රතිලාභ වගකීම | (2,660,228) | (1,685,814) |
| | (6,583,024) | 131,891 |

| සටහන 09-කොටසක ඉපැයුම - කොටසක් සඳහා මූලික ඉපැයුම | 2014/2015 රු. ශත | 2013/2014 රු. ශත |
|---|---|---|
| මූලික කොටසක ඉපැයුම ගණනය කරනු ලබන්නේ කොටස් හිමියන්ට බෙදාදිය හැකි ශුද්ධ ලාභය වර්ෂය තුල නිකුත් කල බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් බෙදා දැක්වීම මගිනි. | | |
| කොටස් හිමියන්ට බෙදාදිය හැකි ශුද්ධ ලාභය | 15,444,205 | 50,687,672 |
| නිකුත් කල බර තැබූ සාමාන්‍ය කොටස් ගණන | 10,000,000 | 10,000,000 |
| කොටසක් සඳහා මූලික ඉපැයුම | 1.54 | 5.07 |

අඩුකල කොටසක ඉපැයුම

2015/03/31 අවසන් වර්ෂය තුල කොටසක ඉපැයුම

ආයතනයේ මූලික ඉපැයුමට සමාන වේ.

## සටහන 10-දේපල පිරියත සහ උපකරණ

| පිරිවැය | ඉඩම් | ගොඩනැගිලි | බදු පදනම මත ලබාගෙන ඇති වත්කම් | රථ වාහන | කාර්යාල උපකරණ | පරිගණක | යන්ත්‍රෝපකරණ හා සවිකිරීම් | ගෘහ භාණ්ඩ | ප්‍රාග්ධන වැඩ | මුළු අගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| ශේෂය 2014 අප්‍රේල් 01 | 226,240,000 | 51,189,589 | 5,350,987 | 78,385,200 | 7,895,496 | 22,924,435 | 632,062 | 31,782,986 | 137,349,785 | 561,750,540 |
| වර්ෂය තුල එකතු කිරීම් | - | - | 50,630,633 | 4,612,365 | 2,157,108 | 14,589,149 | 299,377 | 15,250,911 | 99,595,727 | 187,135,270 |
| ඉවත් කිරීම්/මාරු කිරීම් | - | - | - | - | - | - | - | - | (22,431,384) | (22,431,384) |
| 2014 මාර්තු 31- ශේෂය | 226,240,000 | 51,189,589 | 55,981,620 | 82,997,565 | 10,052,604 | 37,513,584 | 931,439 | 47,033,897 | 214,514,128 | 726,454,426 |
| සමුච්චිත ක්ෂය/ක්‍රමක්ෂය | | | | | | | | | | |
| 2014 මාර්තු 31- ශේෂය | - | 36,569,812 | 178,366 | 53,176,080 | 1,336,349 | 11,424,800 | 120,718 | 4,751,580 | - | 107,557,705 |
| වර්ෂය සඳහා අයකිරීම් | - | 3,839,219 | 11,196,324 | 9,663,098 | 1,005,260 | 12,504,528 | 93,144 | 4,703,390 | | 43,004,963 |
| 2015 මාර්තු 31- ශේෂය | - | 40,409,031 | 11,374,690 | 62,839,178 | 2,341,609 | 23,929,328 | 213,862 | 9,454,970 | - | 150,562,668 |
| 2014 අප්‍රේල් 01 ලේඛන ගත වටිනාකම | 226,240,000 | 14,619,777 | 5,172,621 | 25,209,120 | 6,559,147 | 11,499,635 | 511,344 | 27,031,406 | 137,349,785 | 454,192,835 |
| 2015 මාර්තු 31 ලේඛන ගත වටිනාකම | 226,240,000 | 10,780,558 | 44,606,930 | 20,158,387 | 7,710,995 | 13,584,256 | 717,577 | 37,578,927 | 214,514,128 | 575,891,758 |

# මූල්‍ය වාර්ථා සඳහා සටහන් 2014 /2015

## සටහන 11-ආයෝජිත කොටස්

| | | 2014/2015 රු. ශත | 2013/2014 රු. ශත |
|---|---|---|---|
| සිලෝන් ෂිපින් ලයින් | | 20 | 20 |
| | | 20 | 20 |
| සටහන 12වී-කාර්ය මණ්ඩල ණය | | | |
| ජංගම නොවන | | | |
| කාර්ය මණ්ඩල ණය | 12.1 | 6,367,896 | 6,070,272 |
| කාර්ය මණ්ඩල ප්‍රතිලාභ පෙර ගෙවුම් | 12.2 | 404,258 | 358,714 |
| | | 6,772,154 | 6,428,986 |
| ජංගම | | | |
| කාර්ය මණ්ඩල ණය | 12.1 | 3,376,686 | 3,236,319 |
| කාර්ය මණ්ඩල ප්‍රතිලාභ පෙර ගෙවුම් | 12.2 | 358,309 | 327,968 |
| | | 3,734,995 | 3,564,287 |
| | | 10,507,149 | 9,993,273 |
| සටහන 12.1 සේවකයන්ට දුන් ණය | | | |
| වර්ෂය ආරම්භක ශේෂය | | 9,993,273 | 9,272,511 |
| වර්ෂය තුල ජණනය වු ණය | | 5,041,100 | 5,480,210 |
| ආවරණය වු ණය | | (4,527,225) | (4,759,448) |
| | | 10,507,148 | 9,993,273 |
| කාර්ය මණ්ඩල පෙර ගෙවුම් ප්‍රතිලාභ | | (762,567) | (686,682) |
| වර්ෂයේ අවසන් දිනට ශේෂය | | 9,744,581 | 9,306,591 |
| ජංගම නොවන | | 6,367,896 | 6,070,272 |
| ජංගම | | 3,376,686 | 3,236,319 |
| | | 9,744,582 | 9,306,591 |
| සටහන 12.2- කාර්යය මණ්ඩල පෙර ගෙවුම් ප්‍රතිලාභ | | | |
| වර්ෂය ආරම්භක ශේෂය | | 686,682 | 592,002 |
| වර්ෂ තුල එකතු කිරීම් | | 529,378 | 536,691 |
| ක්‍රමක්ෂය | | (453,493) | (442,011) |
| වසර අවසාන ශේෂය | | 762,567 | 686,682 |
| ජංගම නොවන | | 404,258 | 358,714 |
| ජංගම | | 358,309 | 327,968 |
| | | 762,567 | 686,682 |

ආයතනයේ සේවකයන් සදහා ආයතන ණය මුදල් සහනශීලි පොළී අනුපාත යටතේ සලසනු ලබයි. මෙම ණය මුදලෙහි සාධාරණ අගය දැක්වීමේදී වෙළඳ පොලෙහි ණය මුදල් සපයා දෙනු ලබන පොළී අනුපාතය සහ අගය වට්ටම් කිරීම් සිදුකර ඇත.
පිරිවැය සහ සාධාරණ අගය අතර කාර්ය මණ්ඩල පෙර ගෙවුම් ප්‍රතිලාභ ලෙස දක්වා ඇත. තවද මෙම ණය මුදල් පසුව ක්‍රමක්ෂණය කර මූල්‍ය ප්‍රකාශ වල දක්වා ඇත.

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | 7% | 7% |
| වෙළඳපොළ පොළී අනුපාතය | 12 % | 12% |

## 12බී-පහසු ගෙවීමේ ණය

| | | 2014/2015 | 2013/2014 |
|---|---|---|---|
| | | රු. ශත | රු. ශත |
| ජංගම නොවන | | | |
| දළ ආයෝජනය | 12.3 | 7,787,246 | 128,892 |
| (-) නොඉපයූ මූල්‍ය ආදායම | 12.4 | (1,149,859) | (28,240) |
| | | 6,637,387 | 100,652 |
| ජංගම | | | |
| දළ ආයෝජනය | 12.3 | 5,866,971 | 67,248 |
| (-) නොඉපයූ මූල්‍ය ආදායම | 12.4 | (1,795,194) | (31,424) |
| | | 4,071,777 | 35,824 |
| | | 10,709,163 | 136,476 |
| වර්ෂය ආරම්භක ශේෂය | | 136,476 | - |
| වර්ෂය තුල දළ ආයෝජනය | | 12,479,870 | 151,640 |
| (-) මාසික ලැබීම් | | (1,907,183) | (15,164) |
| | | 10,709,163 | 136,476 |
| (+) නොඉපයූ මූල්‍ය ආදායම | | 2,945,054 | 59,664 |
| විසරේ අවසාන ශේෂය | | 13,654,217 | 196,140 |
| ජංගම නොවන | | 7,787,246 | 128,892 |
| ජංගම | | 5,866,971 | 67,248 |
| | | 13,654,217 | 196,140 |

## 12.4- නොඉපයූ මූල්‍යආදායම

| | 2014/2015 | 2013/2014 |
|---|---|---|
| වර්ෂය ආරම්භක ශේෂය | 59,664 | - |
| වර්ෂය තුල එකතුව | 3,637,849 | 59,664 |
| (-)වර්ෂය තුල පොළී ආදායම | (752,459) | - |
| වර්ෂය අවසාන ශේෂය | 2,945,054 | 59,664 |
| ජංගම නොවන | 1,149,859 | 28,239 |
| ජංගම | 1,795,194 | 31,424 |
| | 2,945,054 | 59,664 |

## සටහන 13-තොග

| | 2014/2015 | 2013/2014 |
|---|---|---|
| අවසන් තොගය | 830,667,613 | 405,992,907 |
| මාර්ගස්ථ තොගය | 64,178,500 | 138,253,781 |
| හානි වූ සහ සෙමින් අලෙවිවන තොග සඳහා වෙන් කිරීම් | (2,659,561) | (2,659,561) |
| | 892,186,552 | 541,587,127 |

# මූල්‍ය වාර්ථා සඳහා සටහන් 2014 /2015

## සටහන-14 වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ

| | 2014/2015<br>රු. ශත | 2013/2014<br>රු. ශත |
|---|---|---|
| වෙළඳ ණයගැතියෝ | 644,869,859 | 489,690,279 |
| ණයගැති පර්යේෂණ ණය ගැති අඩු කිරීම් | (4,360,787) | (4,360,787) |
| | 640,509,072 | 485,329,492 |
| විවිධ ණයගැති | 744,659 | - |
| ලැබිය යුතු කොමිස් | - | 614,205 |
| උත්සව දීමනා | 33,000 | 1,136,000 |
| සේවක ණය ගැතියන්ගේ වැටුප් අත්තිකාරම් | 958,529 | 354,676 |
| විදුලි බිල් තැන්පත් | 140,000 | 140,000 |
| ආරක්ෂක තැන්පත් - ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 950,765 | 904,194 |
| කන්ටේනර් තැන්පත් | - | 140,000 |
| කුලී තැන්පත් | 25,859,511 | 25,429,511 |
| විවිධ තැන්පත් | 494,500 | 1,665,500 |
| වරාය අධිකාරිය- PVQ | 50,000 | 50,000 |
| කලින් ගෙවීම | 4,842,435 | 6,843,138 |
| කාර්යමණ්ඩල සුළු මුදල් අත්තිකාරම් | 13,000 | 11,000 |
| ඇපකර-මහජන බැංකුව | 600,000 | 600,000 |
| ලැබිය යුතු පොළී | 12,866,342 | 16,328,215 |
| ලැබිය යුතු ආදායම් බදු | 4,275,243 | 4,275,243 |
| රදවා ගැනීමේ ලැබිය යුතු එකතු කල අගය මත බදු ගිණුම | 1,024,484 | 1,024,484 |
| රදවා ගැනීමේ එකතු කල අගය මත බදු | 320,922 | 490,704 |
| අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 7,784,039 | 7,784,039 |
| විවිධ වියදම් සඳහා අත්තිකාරම් | 4,169,614 | 181,817 |
| සේවා සඳහා අත්තිකාරම් | 73,160 | 73,160 |
| ටෙන්ඩර් හා අනෙකුත් තැන්පතු | 83,800 | 200,000 |
| තැන්පත් මුදල් ගොඩනැගීමේ ගිණුම | 52,577,201 | 7,500,000 |
| නාවික ඇපකර- මහජන බැංකුව | - | 20,609,846 |
| තෑගි වවුචර් පාලන ගිණුම | - | 101,477 |
| සාලා ආයතනය | - | 9,933,066 |
| රජවාස සුහසාධක සංගමය | - | 600,000 |
| පෙර වර්ෂයේ ලාභාංශ බදු අධි ගැලපුම් ගිණුම | 683,476 | 683,476 |
| ලැබිය යුතු එකතු කල අගය මත බදු | 15,418,919 | - |
| ලැබිය යුතු වෙනත් දෑ | 2,444,150 | - |
| ඩේවිඩ් පීරිස් ආයතනය | 1,074,440 | - |
| ලැබිය යුතු ණය/කල්බදු කුලිය/රක්ෂණය | 150,885 | - |
| | 780,172,146 | 593,003,243 |

## සටහන 15-ආනයනික සහල් බෙදා හැරීමේ මෙහෙයුම්

| | 2014/2015 | 2013/2014 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| ආනයනික සහල් ලැබිය යුතු සහනාධාරය ඉදිරියට ගෙන යාම | 324,164,384 | 702,236,365 |
| (+) වර්ෂයට අදාල පොලිය | 72,461,562 | |
| (-) වසර තුල ලැබීම් | - | (386,760,599) |
| ආනයනික සහල් ලැබිය යුතු සහනාධාරය ඉදිරියට ගෙන යාම | 396,625,946 | 324,164,384 |

| | | 2014/2015 | 2013/2014 |
|---|---|---|---|
| | | රු. ශත | රු. ශත |
| බැංකුවේ ඇති මුදල | | | |
| ලංකා බැංකුව | (ගිණුම් අංකය-8859546) | 1,067,338 | 1,180,170 |
| සම්පත් බැංකුව | (ගිණුම් අංකය-000930000337) | 2,372,943 | 204,498 |
| සම්පත් බැංකුව තීරු බදු රහිත ප්‍රදර්ශණාගාරය | (ගිණුම් අංකය-002930006974) | 4,274,052 | 4,255,737 |
| ලංකා බැංකුව | (ගිණුම් අංකය-1060) | 20,847 | 21,847 |
| NDB බැංකුව | (ගිණුම් අංකය-106340003864) | 2,033,634 | 1,089,588 |
| මහජන බැංකුව - මාතර | (ගිණුම් අංකය-032 1001 6003 7019) | 1,264,897 | - |
| මහජන බැංකුව - කුරුණෑගල | (ගිණුම් අංකය-226 100100206579) | 130,406 | - |
| | | | |
| අතැති මුදල් | | | |
| සුළු මුදල් අග්‍රිමය | | 415,316 | 341,830 |
| අතැති මුදල් | | 14,749,672 | 11,001,128 |
| | | 26,329,105 | 18,094,798 |

### සටහන 17 - කල් බදු මෙහෙයුම් -පොලී වගකීම්

| | WO KJ - 8289 ටොයොටා කාරය | LK - 0018 LK-024 ඉසුසු කෲ කැබ් රථය | KU -7071 KU - 70729 ඇවැන්සා වැගන් | WPKX 9352 නිසාන් ජීප් රථ | KY -6145 KY - 6148 ඇල්ටො කාර් | මුළු අගය |
|---|---|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| ශේෂය 01/04/2014 | 923,856 | 4,752,766 | 12,345,517 | 21,010,372 | - | 39,032,511 |
| වර්ෂය තුල නව කල්බදු ලබාගැනීම් | | | | | 5,175,000 | 5,175,000 |
| (-)වාරික ගෙවීම් | (923,856) | (2,165,077) | (3,527,292) | (3,917,188) | (862,500) | (11,395,913) |
| ශේෂය 31/03/2015 | - | 2,587,689 | 8,818,225 | 17,093184 | 4,312,500 | 32,811,598 |
| විලම්භිත පොලිය | | | | | | |
| ශේෂය 01/04/2014 | 40,812 | 993,944 | 4,042,756 | 7,155,561 | - | 12,233,073 |
| නව කල්බදු ලබාගැනීම් | - | - | - | - | 1,425,000 | 1,425,000 |
| (-)වර්ෂය තුල අය කිරීම් | (40,812) | (675,600) | (1,809,799) | (2,168,237) | (398,291) | (5,092,728) |
| ශේෂය 31/03/2015 | - | 318,344 | 2,232,968 | 4,987,324 | 1,026,709 | 8,565,345 |
| | - | | | | | |
| පොලී වගකීම ජංගම නොවන | - | | | | | |
| ශේෂය 31/03/2014 | | 2,252,174 | 6,585,259 | 11,932,135 | - | 20,769,568 |
| ශේෂය 31/03/2015 | | 395,667 | 4,407,625 | 9,839,435 | 2,655,759 | 17,298,486 |
| පොලී වගකීම ජංගම | | | | | | |
| ශේෂය 31/03/2014 | 883,044 | 1,506,648 | 1,717,502 | 1,922,676 | | 6,029,870 |
| ශේෂය 31/03/2015 | - | 1,873,678 | 2,177,632 | 2,266,425 | 630,032 | 6,947,767 |

# මූල්‍ය වාර්ථා සඳහා සටහන් 2014 /2015

## සටහන 18 - විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම

| | 2014/2015<br>රු. ශත | 2013/2014<br>රු. ශත |
|---|---|---|
| වර්ෂයේ ආරම්භක ශේෂය | 24,976,576 | 18,955,809 |
| වර්ෂය තුල වෙන් කිරීම් | 9,500,813 | 7,135,243 |
| වසර තුල කල ගෙවීම් | - | (1,114,476) |
| වසර අවසන් ශේෂය | 34,477,390 | 24,976,576 |

තක්සෙරු අගය ගෙනහැර දැක්වීමේදී ආයතන කළමණාකාරීත්වය ප්‍රක්ෂිප්ත ඒකක බැර රීතිය උපයෝගි කොට ගෙන ඇති අතර මෙය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තීන් (ලං. ගි. ප්‍ර 19) කාර්යය මණ්ඩල ප්‍රතිලාභ

| විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම | 2014/2015<br>රු. ශත | 2013/2014<br>රු. ශත |
|---|---|---|
| පොළී වියදම | 1,748,360 | 1,269,343 |
| වර්ථමාන සේවා වියදම | 1,610,041 | 1,218,989 |
| මුළු සේවක පිරිවැය (සටහන 06) | 3,358,401 | 2,488,333 |
| හදුනාගත් සත්‍ය ශුද්ධ ලාභ / අලාභය | 6,142,412 | 4,646,909 |
| වර්ෂය තුල ඉපයීම විස්තීරණ ආදායම් ප්‍රකාශය අනුව | 6,142,412 | 4,646,909 |
| හදුනාගත් මුළු විස්තීරණ ආදායම | 9,500,813 | 7,135,243 |

| ප්‍රධාන කළමණාකාරීත්ව උපකල්පන මූල්‍ය උපකල්පන | 2014/2015 | 2013/2014 |
|---|---|---|
| වාර්ෂික පොළී අනුපාතය | 7% | 7% |
| වැටුප් වර්ධක අනුපාතය | 2% | 2% |
| සේවක පිරිවැටුම | 3% | 3% |
| විශ්‍රාමික වයස (වර්ෂ) | 60 | 60 |

ආයතනය තම ව්‍යාපාර කටයුතු ඉදිරි වර්ෂයේදී ද කර ගෙන යාමට හැකි වේ.

| සටහන 19-ශුද්ධ විලම්භිත බදු වගකීම් | 2014/2015<br>රු. ශත | 2013/2014<br>රු. ශත |
|---|---|---|
| වර්ෂය ආරම්භක ශේෂය | 2,803,745 | 2,671,854 |
| වර්ෂය තුල වෙන්කිරීම් | (6,583,024) | 131,891 |
| වර්ෂය අවසාන ශේෂය | (3,779,279) | (2,803,745) |

වලම්භිත බදු තීරණය කරනු ලැබුවේ මූල්‍ය වාර්ථාකරන කාර්යයන් සඳහා සැලකිල්ලට ගනු ලබන වත්කම් හා බැරකම් වල ප්‍රමාණය බදු වාර්ථාකරණය සඳහා සැලකිල්ලට ගනු ලබන ප්‍රමාණය අතර තාවකාලික වෙනස මත ගණනය කිරීමෙනි. බදු ක්‍රියාකාරකම් වල සංසංදනාත්මක මූල්‍ය තත්වය පහත ප්‍රකාශනයේ දක්වා ඇත.

| සටහන 19-ශුද්ධ විලම්භිත බදු වගකීම් | 2014/2015<br>රු. ශත | 2013/2014<br>රු. ශත |
|---|---|---|
| සෙමින් අලෙවි වන තොග සඳහා වෙන්කිරීම් | (744,677) | (744,677) |
| අඩමාණ ණය සඳහා වෙන්කිරීම් | (1,221,020) | (1,221,020) |
| විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් | (9,653,669) | (6,993,441) |
| බදු අරමුණ සඳහා ත්වරිත ක්ෂය | 7,840,088 | 11,762,884.26 |
| | (3,779,279) | 2,803,745 |

## සටහන 20 - කෙටි කාලීන ණය

| | 2014/2015 | 2013/2014 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| කෙටිකාලීන ණය - මහජන බැංකුව | 287,563,682 | 107,510,757 |
| කෙටිකාලීන ණය - සම්පත් බැංකුව | 84,159,670 | 14,704,600 |
| කෙටිකාලීන ණය - ලංකා බැංකුව -1060/8859546 | 459,813,464 | 459,813,464 |
| කෙටිකාලීන ණය ජාතික සංවර්ධන බැංකුව | 138,612,156 | 31,083,420 |
| | 970,148,971 | 613,112,241 |

## සටහන 21 - වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

| | 2014/2015 | 2013/2014 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| වෙළඳ ණය හිමියෝ | 545,254,263 | 391,597,433 |
| විදේශ ආනයන වගකීම | 247,328,184 | 192,559,814 |
| ආනයනික සහල් පොළී | 120,987,630 | 48,526,067 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2,518,278 | 2,811,874 |
| උපචිත වියදම් | 32,408,282 | 30,199,572 |
| ගෙවිය යුතු එකතු කල අගය මත බදු | 10,911,330 | 5,241,351 |
| විගණන ගාස්තු | 148,900 | 168,900 |
| ආරක්ෂක තැන්පත්- ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 950,765 | 904,194 |
| සේවක අර්ථසාධක අරමුදල | 2,420,668 | 2,429,298 |
| සේවක භාරකාර අරමුදල | 290,481 | 291,516 |
| කාර්යාලීය සේවක ණය වැටුප් බැංකුගත කිරීම් ආදිය | 184,120 | 840,545 |
| කාර්යාලීය සේවක ණය -එස්.ටී.සී සුභසාධක සංගමය | - | 392,055 |
| වැටුප් අඩුකිරීම් | 456,567 | 233,173 |
| කාර්ය්‍ය මණ්ඩලය සඳහා සහන ඇති කිරීමේ අරමුදල | 488,105 | 250,000 |
| ඒ .බී.සී ට්‍රේඩ් ඇන්ඩ් ඉන්වෙස්මන්ට් | 985,452 | 2,220,088 |
| අබාන්ස් (පුද්ගලික) සමාගම | 1,920,661 | 4,742,663 |
| මැක්ස් දුරකථන | - | 35,387 |
| සුදර්ශි ශාලාව -එකතුකිරීම් ගිණුම | - | 98,699 |
| පෙර වර්ෂයේ ලාභාංශ බදු ගැලපීම | 1,872,157 | 3,386,000 |
| ස්ක්‍රැප් බැටරි පාලන ගිණුම | - | 251,530 |
| මුද්දර ආවරණ මුදල | 17,450 | 16,675 |
| මුද්දර බදු ගෙවියයුතු ගිණුම | 55,726 | 2,120 |
| එටිසලාට් ලංකා ආයතනය | - | 327,991 |
| විවිධ ණය හිමියෝ | 30,650 | - |
| එටිසලාට් ණය කාඩ්පත | 748,683 | - |
| අභයාරාමය සඳහා ගෙවිය යුතු කුලිය | 8,780,000 | - |
| කුලී සින්නක්කර අත්තිකාරම් | 132, 724 | - |
| ගෙවිය යුතු කල්බදු රක්ෂණ වාරික | 8,416 | - |
| කුලී සින්නක්කර ණය හිමියො | 1,471,511 | - |
| නොමිලේ නිකුත් කරණ භාණ්ඩ පාලන ගිණුම | 231,681 | - |
| සාලා එන්ටප්‍රයිසස් | 248,570 | - |
| | 980,851,254 | 687,526,945 |

# මූල්‍ය වාර්ථා සඳහා සටහන් 2014 /2015

## සටහන 22 - බැංකු අයිරාව

| | | 2014/2015 රු. ශත | 2013/2014 රු. ශත |
|---|---|---|---|
| මහජන බැංකුව | (ගිණුම් අංකය-004100120210918) | 339,841,284 | 222,242,040 |
| මහජන බැංකුව නුවර | (ගිණුම් අංකය-003100190206579) | 1,241,135 | - |
| NDB බැංකුව | (ගිණුම් අංකය-10100060408) | 5,365,786 | 656,132 |
| | | 345,648,205 | 222,898,172 |

## මූල්‍ය වාර්ථා සඳහා සටහන් 2014 /2015

සටහන 23 - සම්බන්ධිත පාර්ශව සමඟ ගණුදෙනු

අ) ප්‍රධාන කළමණාකරණ පාර්ශව සමඟ ගණුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 සම්බන්ධිත වාර්ථාව ප්‍රධාන කළමණාකාරීත්වය යනුවෙන් දක්වා ඇත්තේ ආයතනයේ බලතල සහ වගකීම් වලට යටත් වන ආයතනයේ සැලසුම්කරණය, අධීක්ෂණය සහ පාලනය කරනු ලබන පාර්ශවයන් වන අතර අධ්‍යක්ෂක මණ්ඩලය (විධායක නිළධාරීන් , අධක්ෂකවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වයන) පාර්ශව ආයතනයේ ප්‍රධාන කළමණාකාරීත්ව සේවා මණ්ඩලය වේ

(i) අධක්ෂක වරුන් සඳහා ණය ලබා දීම්ශ

කිසිදු ණය මුදලක් ආයතනය අධක්ෂක වරුන්ට ලබා දී නොමැත.

(ii) ආයනයයේ ප්‍රධාන කළමණාකාරිත්වයට ගෙවීම

| | 2014/2015 රු. ශත | 2013/2014 රු. ශත |
|---|---|---|
| කෙටි කාලීන සේවක වරප්‍රසාද | 5,714,064 | 5,579,323 |
| දීර්ඝ කාලීන සේවක වරප්‍රසාද | 562,552 | 483,885 |

(iii) ආයතනයේ ප්‍රධාන කළමණාකාරීත්වය සමග අනෙකුත් ගණුදෙනු

වෙනත් කිසිදු ගණුදෙනුවක් ප්‍රධාන කළමණාකාරිත්වය සමඟ නොමැත .එය මූල්‍ය ප්‍රකාශන වල සටහන් 23 (අ) හි හෙලි දරව් කර ඇත.

## සටහන 24 - ප්‍රාග්ධන වගකීම්

2015 මාර්තු 31 දිනට කිසිදු ප්‍රාග්ධන වගකීමක් අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කර නැත.

## සටහන 25 - ශේෂ පත්‍රයෙන් පසු සිදු වූ සිදුවීම්

වාර්ථාකරණ දිනයට පසු ආයතනයේ ගිණුම් වලට බලපානු ලබන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් සිදු වී නොමැත.

## සටහන 26 - සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු සැසඳීම සඳහා ශේෂයන් පසුගිය වර්ෂයෙන් ලබාගෙන ඇති අතර අවශ්‍ය විටදී නැවත වර්ගීකරණය කොට මෙම වර්ෂය සටහන් කර දක්වා ඇත.

## සටහන 27- මූල්‍ය අවදානම් කළමණාකරණය

### දළ විශ්ලේෂණය.

පහත සඳහන් මූල්‍යමය මෙවලම් මඟින් ආයතනය මුහුණපාන මූල්‍යමය අවදානම් අනාවරණය කරනු ලබයි.

1) ණය අවදානම.

2) ද්‍රවශීලතා අවදානම.

3) වෙළඳපොළ අවදානම (විනිමය අනුපාත සහ පොළී අනුපාත වෙනස්වීමේ අවදානම ඇතුළුව.)

මෙම සටහන මඟින් ඉදිරිපත් කරනුයේ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක තොරතුරු එකින් එක අනාවරණය කිරීම වන අතර ආයතනයේ පරමාර්ථ, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි පිලිබඳව ගුණාත්මක සහ ප්‍රමාණාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධවයි.

අවදානම් කළමණාකරන රාමුව

ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය කළමණාකරණ රාමුව පිහිටුවීම හා අධීක්ෂණය සඳහා සමස්ථ වශයෙන් වගකීමට බැදී සිටී. ආයතනයේ අවදානම් කළමණාකරණ ප්‍රතිපත්ති,

### ණය අවදානම.

ණය ලබාගත් ආයතන ණය ගෙවීම පැහැර හැරීය විට ආයතනයේ ලැබීම් අවපාත වේ. මෙහිදී ආයතනය වෙත ලැබෙන ආදායම් මග හැරීයාමේදී සිදුවන පාඩුව ණය අවධානම වේ.

පහත සඳහන් මූල්‍යමය වත්කම් මගින් උපරිම ණය අවදානම් තත්වය පිළිබඳව අනාවරණයවේ. නියමිත දිනට පැවති උපරිම ණය අවදානම් තත්වය පහත අනාවරණය කර ඇත.

| | 2014/2015 | 2013/2014 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| සේවකයින් සඳහා දුන් ණය | 10,507,149 | 9,993,273 |
| පහසුගෙවීමේ ණය යෝජනා ක්‍රමය | 10,709,163 | 136,476 |
| ආනයනික සහල් සහනාධාර | 396,625,946 | 324,164,384 |
| කෙටිකාලීන ආයෝජන(ස්ථිර තැන්පත්) | 358,773,901 | 333,655,365 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 780,172,146 | 593,003,245 |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 26,329,105 | 18,094,797 |
| | 1,583,117,410 | 1,279,047,540 |

# මූල්‍ය වාර්ථා සඳහා සටහන් 2014 /2015

## ද්‍රවශීලතා අවදානම.

ද්‍රවශීලතා අවදානම යනු මූල්‍ය ආයතනය විසින් අන් අයට මුදල් ගෙවීමේදී ද්‍රවශීලී මුදල් නොමැතිවීම නිසා ඇතිවන අවහිරතාවයයි. මෙහිදී මූල්‍ය හානියක් නොවන පරිදි අදාල ගෙවීම් සිදුකිරීමට ආයතනය සතුව මුදල් නොමැති වීම ආයතනයේ පිලිගැනීමට හානියක් වන බැවින් ආයතනය සතුව ප්‍රමාණවත් ද්‍රවශීලී මුදල් ලබාගත යුතුය.

ද්‍රවශීලතා අවදානම මිණුම්කරණය සඳහා ආයතනය මෙහෙයුම් මුදල් ප්‍රවාහය, මුදල් සහ මුදල් වලට සමාන දෑ සහ මූල්‍ය ආයතන සඳහා තබා ඇති ඇපකරුවන් පිළිබඳව සැලකිල්ල යොමුකල යුතුයි.

| ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකම් | 2014/2015<br>රු. ශත | 2013/2014<br>රු. ශත |
|---|---|---|
| පොළී නොවන වගකීම් | 24,246,253 | 26,799,438 |
| ගෙවිය යුතු ආදායම් බදු | 4,636,880 | 11,046,128 |
| කෙටිකාලීන ණය | 970,148,971 | 613,112,241 |
| වෙළඳ සහ වෙනත් ණයහිමියන් | 980,851,254 | 687,526,945 |
| බැංකු අයිරාව | 345,648,205 | 222,898,172 |
| | 2,325,531,563 | 1,561,382,924 |

**වෙළඳපොළ අවදානම**

වෙළඳපොළ අවදානම යනු වෙළඳපොළ මිල ගනන්, විනිමය අනුපාත, පොළී අනුපාත යනාදිය වෙනස් වීම ආයතනයේ ආදායමට බලපාන ආකාරය වේ. වෙළඳපොළ අවදානම් කළමණාකරනය කිරීමේ පරමාර්ථය ආයතනයට බලපාන වෙළඳපොළ අවදානම් අවම කර ගැනිමයි.

**පොළී අනුපාත අවදානම**

වෙළඳපොළේ පොළී අනුපාත විචල්‍ය වීම මූල්‍ය ආයතන විසින් ලබාදී ඇති ණය පොළී වෙනස්වීමට බලපායි. මෙහිදී මූල්‍ය ආයතනය ණයදීම සහ ණය ලබාගැනීම අතර මූල්‍ය තත්වය මඟින් අදාල තත්වය කළමණාකරණය කරගත යුතුය. කෙසේ වෙතත් දීර්ඝකාලීන විචල්‍ය අනුපාත මත ලබා ගැනීම් හෝ තැන්පත් කිරීම් මඟින් ආයතනයට අවදානමක් ඇති වේ.